09672

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**21 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)

| | |
|---|---|
| සිංහල භාෂාව හා සාහිත්‍යය I, II<br>சிங்களமொழியும் இலக்கியமும் I, II<br>Sinhala Language and Literature I, II | පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>Three hours |

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

## සිංහල භාෂාව හා සාහිත්‍යය I

**උපදෙස් :**

(i) **සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න.** මෙම ප්‍රශ්න පත්‍රය සඳහා **ලකුණු 40ක්** ලැබේ.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.

(iii) **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**

(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

- අංක **1** සිට **3** තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

**1.** සිරිපාල **දෙලොවක් අතර අතරමං වී** සිටියේ ය.
(1) ලෝක දෙකක් අතර අතරමං වී
(2) නිශ්චිත නිගමනයකට පැමිණීමට නොහැකි ප්‍රශ්නයකට මැදි වී
(3) පහසුවෙන් විසඳාගත හැකි ප්‍රශ්නයකට මුහුණ දී
(4) දෙපාර්ශ්වයෙන් එක් පාර්ශ්වයකට මැදි වී

**2.** **භණමිටි අදහස්** දරන්නන්ගෙන් සමාජයට වන යහපතක් නැත.
(1) කාලයට නොගැළපෙන අදහස්
(2) සියල්ලන්ගේ එකඟතාවක් නැති අදහස්
(3) මෝඩයන් දක්වන අදහස්
(4) යම් අවස්ථාවක මතු වන විකල්ප අදහස්

**3.** ඔහු **තෙලෙන් කා කිරෙන් අත සෝදන්නෙකි.**
(1) තමන් සතු සම්පත් විනාශ කර ගන්නෙකි.
(2) පස්ගෝරසවලින් අඩුවක් නොමැති අයෙකි.
(3) ධාන්‍යාදියෙන් අඩුවක් නැති පුද්ගලයෙකි.
(4) සියලු සැප සම්පතින් ආඪ්‍ය වූවෙකි.

- අංක **4** සිට **6** තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

**4.** විචාරකයාගේ තර්කශ වචන හමුවේ රචකයා ............................. වූයේ ය.
(1) සම්මුඛ (2) දුර්මුඛ (3) ප්‍රමුඛ (4) අභිමුඛ

**5.** ඥාතිත්වය අනුව අමල් නිමල්ගේ වැඩිමහල් සහෝදරයෙකි. එබැවින් අමල් නිමල්ට වඩා .......................... ය.
(1) ශ්‍රේෂ්ඨතර (2) වෘද්ධතර (3) සුන්දරතර (4) ප්‍රවීණතර

**6.** එකඟතාවකට පැමිණි දෙපාර්ශ්වය විසින් අස්සන් කරන ලද්දේ ............................. ගිවිසුමකි.
(1) අවහිරතා (2) සංකුලතා (3) අනුකූලතා (4) අවබෝධතා

[දෙවැනි පිටුව බලන්න.

CamScanner

7. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පෙළිය තෝරන්න.
   (1) ගොලුබෙල්ලා, යථාර්ථය, වෙරළ, හැලිය
   (2) කනාටු, කිකිණි, ගෘහස්ත, ජනාකීර්ණ
   (3) පිළිරුව, රුධිරාණු, වළලු, විභීෂණ
   (4) දුෂ්ඨ, රණකෙළි, වෙලඹ, සමථකරණය

8. වාරණ, දීන, මුල්ල, කෑම යන වචනවල **පළමු අකුරෙහි** අන්තර්ගත පිල්ලම අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
   (1) ඇලපිල්ල, කෙටි පාපිල්ල, දීර්ඝ ඉස්පිල්ල, දීර්ඝ ඇදපිල්ල
   (2) ඇලපිල්ල, දීර්ඝ ඉස්පිල්ල, කෙටි පාපිල්ල, දීර්ඝ ඇදපිල්ල
   (3) දීර්ඝ ඇදපිල්ල, දීර්ඝ ඉස්පිල්ල, කෙටි පාපිල්ල, ඇලපිල්ල
   (4) ඇලපිල්ල, දීර්ඝ ඇදපිල්ල, දීර්ඝ ඉස්පිල්ල, කෙටි පාපිල්ල

9. 'පන්තිය' යන පදයෙහි අන්තර්ගත ව්‍යඤ්ජන අක්ෂර වර්ග වනුයේ,
   (1) දන්තජ, මූර්ධජ හා ඕෂ්ඨජ ය.
   (2) ඕෂ්ඨජ, මූර්ධජ හා කණ්ඨජ ය.
   (3) කණ්ඨජ, දන්තජ හා ඕෂ්ඨජ ය.
   (4) ඕෂ්ඨජ, දන්තජ හා තාලුජ ය.

10. අකාරාදි පිළිවෙළ **නිවැරදි ව** දැක්වෙන පද පෙළිය තෝරන්න.
   (1) ජයතිලක, නවගත්තේගම, වික්‍රමසිංහ, සේනානායක
   (2) ගුණසේකර, ගුනසිංහ, කම්මැල්ලවීර, සුරවීර
   (3) කුමාරසිංහ, ජයකොඩි, සරච්චන්ද්‍ර, නන්දිමිත්‍ර
   (4) කරුණාසේන, දයාසේන, කරුණාරත්න, සුනේත්‍රා

11. අනුක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
   (1) නාගරිකයෙක්, ව්‍යාපාරිකයන්, අධිපතියෙක්, මෙහෙසියක
   (2) වනචාරියකු, වැද්දෙක්, පූජකයකු, ඇමතියෙක්
   (3) ඌරකු, වැඳිරියක, අංගනාවන්, අහිංසකයකු
   (4) ලේඛිකාවක්, ධනවතියක, බලවත්තු, මෝඩයන්

12. 'සංචාරකයා ඔරුවෙන් ගඟ තරණය කළේ ය' යන වාක්‍යයෙහි '**ඔරුවෙන්**' යන්නෙහි විභක්තිය කුමක් ද?
   (1) කරණ (2) අවධි (3) සම්බන්ධ (4) කර්ම

13. 'දසදෙස' යන්න අයත් වන්නේ,
   (1) විභක්ති සමාසයට ය.
   (2) විශේෂණ සමාසයට ය.
   (3) අන්‍යාර්ථ සමාසයට ය.
   (4) අව්‍යය සමාසයට ය.

14. 'වේද + ඉක' යන ප්‍රකෘතිය හා ප්‍රත්‍යය එක්වූ විට සකස් වන පදය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
   (1) වෙදික (2) වේදයික (3) වේදික (4) වෛදික

15. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් **නොවන** පදයක් සහිත වරණය තෝරන්න.
   (1) නිපාත - මෙන්, සේ, වැනි, බඳු
   (2) තද්ධිත - මුත්තණු, මලණු, බෑනණු, පුතණු
   (3) මිශ්‍ර ක්‍රියා - සිනාසිසී, තරමින්, යමින්, බාමින්
   (4) පර රූප සන්ධිය - ගොක්කොළ, හද්දවස, අස්සන, ළිබ්බොක්ක

16. **ප්‍රයෝජ්‍ය ක්‍රියාවක්** යෙදී ඇති වාක්‍යය කුමක් ද?
   (1) ඉන්ද්‍රජාලිකයා සිත්තමක් මවයි.
   (2) සංවිධායකයා අසුන් පනවයි.
   (3) බලවතා දුබලයාට රවයි.
   (4) අභිකුණ්ඨිකයා රිළවකු නටවයි.

- අංක 17 සිට 19 තෙක් ප්‍රශ්නවල **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

17. දේශකයා තම අදහස **අවධාරණය** කළේ ය.
   (1) ඇඩි ව ප්‍රකාශ කිරීම
   (2) අර්ථ විග්‍රහ සහිත ව ප්‍රකාශ කිරීම
   (3) විධිමත් ව ප්‍රකාශ කිරීම
   (4) තර්කානුකූල ව ප්‍රකාශ කිරීම

18. විදුහල්පතිතුමා ආචාර්ය මණ්ඩලයට **තොවක්** සිතින් ස්තුතිය පිරිනැමී ය.
   (1) වංක (2) වංචනික (3) අවංක (4) සංවේදී

[තුන්වැනි පිටුව බලන්න.

19. ඒ බුද්ධිමතා **අනතිමානී** ගුණයෙන් යුක්ත ය.
(1) අධික වූ මාන්නයෙන් යුතු (2) අධික වූ මාන්නයෙන් තොර
(3) මාන්නයෙන් තොර (4) නිරහංකාර

20. දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමග බැඳී **නොපවතින** පද පේළිය ඇතුළත් වරණය තෝරන්න.
(1) කෝණමානය, කවකටුව, අඩිරූල, දුරේක්ෂය
(2) නවකතාව, කෙටිකතාව, කාව්‍ය සංග්‍රහය, නාට්‍ය පිටපත
(3) සරම, කලිසම, කමිසය, තොප්පිය
(4) ඉදිකටුව, නූල්බෝලය, රෙද්ද, කතුර

21. එක් එක් පද පේළියේ දක්වා ඇති පදවලට **සමානාර්ථ යෙදුම්** පමණක් ඇතුළත් වරණය තෝරන්න.

| | | | | |
|---|---|---|---|---|
| (1) | චක්‍රය - රෝදය, | වනය - උද්‍යානය, | තෘණ - තණ, | රශ්මි - රැස් |
| (2) | දොර - ද්වාර, | වත - වස්ත්‍රය, | මංගල - මඟුල, | ගිරි - කන්ද |
| (3) | විමාන - විමන, | ගුහාව - ලෙන, | බාහුව - උර, | මැණික් - මිණි |
| (4) | වෛරය - තරහ, | ආහාර - බත්, | සන්දේශය - පණිවුඩය, | රට - දේශය |

22. මුලින් දී ඇති පදයට **සමානාර්ථයක් නොදෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) ගෙය - ගෘහය, නිවස, නිවාසය, ශාලාව (2) අනංගයා - මල්සරා, මල්හී, අනඟ, මින්දද
(3) ලෝකය - ජගත්, ලොව, දිය, ලෝ (4) අම්මා - මව, මාතෘ, ජනනී, මාතා

23. **විරුද්ධාර්ථවත්** පද යුගලයක් ඇතුළත් **නොවන** වරණය තෝරන්න.
(1) කාර්ය - අකාර්ය (2) සාවද්‍ය - නිරවද්‍ය
(3) ඥාති - මිත්‍ර (4) සුගුණ - දුගුණ

24. වැරදි අදහස දෙන ප්‍රකාශය තෝරන්න.
(1) වර්ගාන්තාක්ෂර හා ඝෂ්ඨාක්ෂර සමාන ය.
(2) 'විකුමැති' යනු ස්වර සන්ධි පදයකි.
(3) 'සගසිරි අසාලා' මෙහි 'අසාලා' යනු පූර්ව ක්‍රියා පදයකි.
(4) 'ලියන' යනු වර්තමාන කෘදන්ත පදයකි.

25. පහත දැක්වෙන වාක්‍ය අතුරෙන් මනා පද ගැළපීමෙන් යුක්ත, අර්ථාන්විත වාක්‍යය තෝරන්න.
(1) නගර සභාවෙහි මුඛ්‍ය කාර්යය කුණු ඉවත් කිරීම පිණිස ය.
(2) නිදහස් අදහස් ජනිත කිරීම ස්වාධීන දේශයක් පමණි.
(3) බොහෝ තරුණ තරුණියන් රට හැර යනු දක්නට ලැබේ.
(4) ගිරි දුර්ගය පසු කිරීමට පල්ලමක් බැසිය යුතු ම ය.

● අංක 26, 27 ප්‍රශ්න යටතේ දක්වා ඇති අදහසට වඩාත් ම ගැළපෙන ප්‍රස්තාව පිරුළ අන්තර්ගත වරණය තෝරන්න.

26. යමක් අවිනිශ්චිත ස්වරූපයෙන් පැවතීම
(1) එළිපත්ත උඩ ඉන්න බළලා වගේ.
(2) දත් තිස් දෙකට හිර වූ දිව වගේ.
(3) මඩේ හිටවපු ඉන්න වගේ.
(4) ගහෙන් වැටුණු මිනිහට ගොනා ඇන්න වගේ.

27. පිටින් පෙනෙන දේට වඩා සම්පූර්ණයෙන් වෙනස් දෙයක් අභ්‍යන්තරයේ වීම
(1) උදේ පටන් වතුර ඇදල හැන්දෑවට කළේ බින්දා වගේ.
(2) ගලෙන් පට්ටයක් ගන්නා වගේ.
(3) කොහොඹ ගහට කරවිල වැල ගියා වගේ.
(4) හක්කෙ බුදුරැස් බොක්කෙ දඩමස් තිබෙන්නා වගේ.

28. ආගම සන්ධියට හා ස්වරාදේශ සන්ධියට අදාළ නිදසුන් පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) මහෝපකාර, නිරවුල් (2) නිරවුල්, පන්තිස්
(3) නිරවුල්, මහෝපකාර (4) පන්තිස්, මහෝපකාර

[හතරවැනි පිටුව බලන්න.

CamScanner

● අංක **29, 30** යටතේ දක්වා ඇති ප්‍රශ්නවල **ව්‍යාකරණානුකූල ව නිවැරදි** වාක්‍යය තෝරන්න.

**29.** (1) දරුවනි, වඳුරන් සේ කෑම සඟවා ගෙන නො කව.
(2) අසුරයෝ හා සුරයන් ගැටෙති.
(3) ලේඛකයා කවිකයෙක් ද විචාරකයෙක් ද වෙති.
(4) රටට, ජනතාවට හිතැති යහපත් පාලකයෙක් පහළ වේවා!

**30.** (1) අසරණයෝ අභාග්‍යවන්තයන් වූ.
(2) කායික රෝග විශේෂඥයෝ මානසික රෝග විශේෂඥයෝ නො වෙති.
(3) මැතිවරණයේ දී ඡන්දදායකයෝ නිවැරදි තීරණයක් ගනිව්.
(4) ඇතැම් මිනිස්සු වංචනික ක්‍රියාවල නිරතවන්නේ ඇයි?

**31.** ● තේ හැන්දෙන් එකක් .............................. උදයට බොන්න.
● ඈ ගැබිනියක .............................. රඟපෑවා ය.
● ජලගැල්ම .............................. කුඹුරු විනාශ විය.
● දේශය ගොඩ නැඟීම .............................. දායක වන්න.

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?

(1) පමණ, මෙන්, නිසා, සඳහා
(2) පමණ, නිසා, මෙන්, සඳහා
(3) පමණ, සඳහා, නිසා, මෙන්
(4) පමණ, නිසා, සඳහා, මෙන්

**32.** පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
"මං නැති අල්ල පනල්ලෙ හොරෙක් ගෙට රිංගලා"

(1) මා ගෙදර සිටින අවස්ථාවේ ම සොරකු ගෙදරට පැමිණ ඇත.
(2) මා අසල නිවසට ගිය අවස්ථාවේ සොරකු ගෙදරට පැමිණ ඇත.
(3) මා සොරා අල්ලා ගැනීමට උත්සාහ කරද්දී ඔහු ගෙදරට ඇතුළු වී ඇත.
(4) මා නොමැති අවස්ථාවක සොරකු ගෙදරට පැමිණ ඇත.

**33.** ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මහතා විසින් ඉදිරිපත් කරන ලද අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනාවක් **නොවන්නේ** මින් කුමක් ද?

(1) සියලු ම දරුවන්ට හොඳ අධ්‍යාපනයක් නොමිලයේ ලබා දීම
(2) ග්‍රාමීය පාසල් රාශියක් බිහි කිරීම
(3) ශාස්ත්‍රීය හා වෘත්තිය විෂයධාරාවලින් යුත් මධ්‍ය විද්‍යාල රැසක් පිහිටුවීම
(4) ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබීම අනිවාර්ය කිරීම

**34.** වෙර වීරිය ඇතත් හිතේ
පියකරු බව ඇතත් වතේ
දහදිය නොම සැලෙන ගතේ
ඔබ පොළවට බරකි පුතේ

යන පද්‍යයේ අදහස නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

(1) ශරීර ශක්තියෙන් හා මුහුණේ පැහැපත් බවින් යුතු ව මහපොළොවට බරක් නොවී රට වෙනුවෙන් ශ්‍රම දායකත්වය ලබාදිය යුතු බව
(2) ශරීර ශක්තිය හා මුහුණේ පැහැපත් බව තිබුණ ද රට වෙනුවෙන් ශ්‍රම දායකත්වයක් සපයන්නේ නැති නම් ඔහුගෙන් පලක් නැති බව
(3) රට වෙනුවෙන් ශ්‍රමය වැය කිරීම අනිවාර්යයෙන් කළ යුතු වුවත් ශරීර ශක්තිය හා මුහුණේ පැහැපත් බව රැක ගත යුතු බව
(4) මහපොළොවට බරක් වන්නේ ශරීර ශක්තිය හා මුහුණේ පැහැපත් බව රැක ගනිමින් ශ්‍රම දායකත්වය සැපයීම නොකළ විට බව

[පස්වැනි පිටුව බලන්න.

CamScanner

**35.** හුණුවටයේ කතාව නාට්‍යයේ ඇතුළත්,

"අප්ප උඹේ හොර දෙවු වා
අම්ම හරිම කුනකටුවා
ඒ හින්දා පුතේ උඹට
මුළු ලෝකෙ ම දණ නමාවි"

යන ගීය කියන්නේ,

(1) ගෲෂා ය. (2) නටාලියා ය. (3) සයිමන් ය. (4) අසඩක් ය.

**36.** "වැහි වලාකුළ පැ කළු යයි ඔබේ
නො හොබිති' යි කිසි ලෙස් නො සතොස් නොවන්
සිරුර පැයෙනු ගත් සුදනෝ ලොවේ
නො හඳුනත් උතුමන් ගුණයෙන් විනා"

යන පද්‍ය කොටස ද ඇතුළත් වැහි වලාකුළ පද්‍ය නිර්මාණයේ රචකයා වන්නේ,

(1) සිරි ගුනසිංහ ය. (2) කුමාරතුංග මුනිදාස ය.
(3) ගුණදාස අමරසේකර ය. (4) ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ ය.

**37.** භාෂාව සම්බන්ධයෙන් **වැරදි** ප්‍රකාශය තෝරන්න.

(1) භාෂාව මානවයාගේ නිෂ්පාදනයකි.
(2) ලෝකයේ පවතින භාෂා සංඛ්‍යාව නිශ්චිත ව කිව නොහැකි ය.
(3) භාෂාව කායික ව ලැබෙන දෙයක් නොවන අතර එය ලබා ගන්නේ පරිසරයෙනි.
(4) භාෂාව හා සංස්කෘතිය අතර සම්බන්ධතාවක් නොමැත.

**38.** පයින් ගොයම් පාගන විට එළන පැදුර කමත් භාෂාවේ දී හඳුන්වන නම කුමක් ද?

(1) මාගල (2) කුවාලම (3) යතුර (4) බාන

**39.** 'ප්‍රාචීන භාෂා පිළිබඳ වත් ප්‍රතිචීන භාෂා පිළිබඳ වත් බලංගොඩ නාහිමියන් සතු ව පැවති ප්‍රවීණත්වය අතිමහත් ය.' මෙහි ප්‍රාචීන භාෂා යනු,

(1) සංඥා භාෂා ය. (2) අපරදිග භාෂා ය.
(3) චීන භාෂා ය. (4) පෙරදිග භාෂා ය.

**40.** පහත දැක්වෙන ප්‍රකාශයේ අදහස වඩාත් ම නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

"කවියෙකු හැටියට ශේක්ෂ්පියර්ගේ පතළ කීර්තිය ඔහුගේ විවිධ කාව්‍ය නිර්මාණවලින් සහ තුදුස් පද සැහැලිවලින් පළ වන නමුදු එකී අපූර්ව කවීත්වය වඩාත් ම ප්‍රකාශයට පත්වන්නේ ඔහුගේ නාට්‍ය නිර්මාණයන්හි අන්තර්ගත පද්‍ය නිර්මාණවලිනි."

(1) විවිධ කාව්‍ය නිර්මාණවලින් සහ සැහැලිවලින්, කවියෙකු ලෙස ශේක්ෂ්පියර්ගේ කීර්තිය පැතිරුණ ද ඔහුගේ කවීත්වය වඩාත් ප්‍රකට වන්නේ නාට්‍ය නිර්මාණවල ඇතුළත් පද්‍ය නිර්මාණවලිනි.
(2) ශේක්ෂ්පියර් කවියකු වන අතර ඔහුගේ කීර්තිය ප්‍රකට වී ඇත්තේ විවිධ කාව්‍ය නිර්මාණවලින් සහ තුදුස් පද සැහැලිවලින් පමණක් නොවන අතර නාට්‍යවල ඇතුළත් පද්‍ය නිර්මාණ ද ඊට හේතුපාදක වී ඇත.
(3) ශේක්ෂ්පියර් කවියකු ලෙස ඉමහත් කීර්තියක් අත්කර ගැනීමට විවිධ කාව්‍ය නිර්මාණ සහ තුදුස් පද සැහැලි ද හේතු වී ඇති අතර ඔහුගේ කවීත්වය වඩාත් ඉස්මතු වන්නේ නාට්‍යවල ඇතුළත් පද්‍ය නිර්මාණවලිනි.
(4) විවිධ කාව්‍ය නිර්මාණ සහ තුදුස් පද සැහැලිවලින් කවියෙකු ලෙස ශේක්ෂ්පියර් කීර්තියක් අත්කර ගත්ත ද නාට්‍ය නිර්මාණවල ඇතුළත් පද්‍ය නිර්මාණවලින් ඔහුගේ කවීත්වය ප්‍රකට ව පෙනේ.

* *



CamScanner

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**21 S I, II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)**
**General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)**

**සිංහල භාෂාව හා සාහිත්‍යය I, II**
**சிங்களமொழியும் இலக்கியமும் I, II**
**Sinhala Language and Literature I, II**

## සිංහල භාෂාව හා සාහිත්‍යය II

※ ප්‍රශ්න **සියල්ලට ම** උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන **80**කි.

**1.** (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) සිංහල අක්ෂරමාලාවේ ඇතුළත්
- (අ) සඤ්ඤක අක්ෂරයක් ලියා දක්වන්න.
- (ආ) අන්තඃස්ථාක්ෂරයක් ලියා දක්වන්න.

(ii) පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන **දෙක පමණක්** නිදොස් කර ලියන්න.

"එම සිද්දිය පිළිබඳ තොරතුරු ගවේෂණය කළ විමර්ගන නිළධාරීහු එකී තොරතුරු අධිකරණය වෙත වාර්තා කළහ."

(iii) පහත සඳහන් පදවලට විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.
- (අ) කීර්තිය (ආ) සුසිරිත

(iv) පහත සඳහන් අදහස්වලට ගැළපෙන තනි පද ලියන්න.
- (අ) තනි ව හැසිරෙන (ආ) සමාන හදවතක් ඇති

(v) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් සමාස පද **දෙක** ලියන්න.

"උපසභාපතිතුමා කළ ප්‍රකාශය නිවැරදි නොවන බව පැමිණ සිටි සාමාජිකයන්ගෙන් බහුතරයක් දෙනා එක හඬින් ප්‍රකාශ කළහ."

(vi) පහත සඳහන් වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර නැවත ලියන්න.
- (අ) සිංහයෝ මෙන් සැරසුණු දරුවෝ ජාතික ධජ ඔසවමින් ක්‍රීඩකයන් දිරිගැන්වූහ.
- (ආ) සාහිත්‍ය සංගමයේ සාමාජිකයෝ හෙවත් සිසුන් විවිධ නිර්මාණ ඉදිරිපත් කළහ.

(vii) 'මහා මාර්ගවල ගමනාගමනයේ යෙදෙන ඇතැම් රියැදුරන් සිත්පිත් නැත්තන් සේ ක්‍රියා කිරීම රිය අනතුරුවලට ප්‍රධාන හේතුවකි' යන වාක්‍යයේ ඇතුළත් යුගල පදයක් හා විශේෂණ පදයක් ලියන්න.

(viii) පහත සඳහන් යෙදුම්වල පළමුවන වචනය සමග දෙවන වචනයේ නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන ලෙස පළමුවන වචනය හෝ දෙවන වචනය සකස් කර ලියන්න.
- (අ) චන්ද්‍ර මඬල (ආ) සොබා ධර්මය

(ix) පහත සඳහන් වාක්‍යවල ඇති තද කළු අකුරින් මුද්‍රිත පද කවර ක්‍රියා ප්‍රවර්ගයට අයත් වේ ද?
- (අ) නොනැවති ඉදිරියට ම **යවු**.
- (ආ) හිරු **බසිත** කෙමෙන් කෙමෙන් සඳ අහසට නැගෙයි.

(x) පහත සඳහන් වාක්‍ය කර්තෘකාරකයට හරවා ලියන්න.
- (අ) දේශප්‍රේමීන් විසින් දේශය ආරක්ෂා කරනු ලබයි.
- (ආ) ගුරුවරුන් විසින් නිරන්තරයෙන් ශිෂ්‍යයෝ යහමගට යොමු කෙරෙති.

(ලකුණු 02 × 10 = 20 යි)

[හත්වැනි පිටුව බලන්න.

CamScanner

**2.** පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් **එකක්** තෝරා ගෙන **වචන 250කට නො අඩු** වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා **යෝග්‍ය මාතෘකාවක්** ද යොදන්න.

(අ) සුළු වර්ෂාවක දී පවා මෙරටෙහි ඇතැම් නගර ජලයෙන් පිරීයනු නිබඳ ව දැකිය හැකි ය. එම නිසා නාගරික ජනතාවට ආපදා රැසකට මුහුණ දීමට සිදු වී ඇති අතර ඒවා එදිනෙදා ජන ජීවිතයට ද අහිතකර ලෙස බල පා ඇත. පරිසර හිතකාමී යහපත් මානව චර්යා හැඩගස්වා ගැනීම සහ විධිමත් නගර සැලසුම්කරණය මඟින් මෙම ගැටලුව සඳහා විසඳුම් ලබා ගැනීම උචිත ය. ඒ වෙනුවෙන් අදාළ වගකිව යුතු ආයතනවල සහ පුද්ගලයන්ගේ අවධානය හා සක්‍රිය දායකත්වය ද නොමඳ ව ලැබිය යුතු ය.

(ආ) වයස් භේදයකින් තොරව වර්තමානය වන විට බොහෝ දෙනා 'සමාජ මාධ්‍ය' ඇසුරු කරති. නිවැරදි තොරතුරු හුවමාරු කර ගැනීම, දැනුම ලබා ගැනීම, එකිනෙකා අතර යහපත් සම්බන්ධතා ඇති කර ගැනීම ආදි ප්‍රයෝජන රැසක් මෙමඟින් ලබා ගත හැකි ය. එසේ වුවත් සමාජ මාධ්‍ය අවභාවිත කිරීම නිසා ඇතැම් විට පැන නැගෙන ගැටලු සමාජයට හිතකර නො වේ. එම නිසා සමාජ මාධ්‍ය භාවිතයේ දී පරිශීලකයන්ගේ 'ස්වයං නියාමනය' අත්‍යවශ්‍ය බව නිරතුරු ව අවධාරණය කෙරේ.

(ඉ) ලෝක පරිසර සංවිධානවල දැඩි අවධානයට ලක් වී ඇති 'ප්ලාස්ටික් අපද්‍රව්‍ය' සම්බන්ධ ගැටලුව, ශ්‍රී ලංකාවට ද ප්‍රබල තර්ජනයක් වී ඇත. අවිධිමත් ලෙස පරිසරය වෙත මුදා හැරෙන මේ අපද්‍රව්‍ය කඳු, බොහෝ සෞඛ්‍ය හා පාරිසරික ගැටලුවලට මූලික වී ඇත. එම ගැටලුවලට පිළියම් ලෙස පරිසර නීති බලාත්මක කිරීම, ප්ලාස්ටික් දූෂණයේ අහිතකර බලපෑම් පිළිබඳ ජනතාව දැනුවත් කිරීම, අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය, පරිසර හිතකාමී ඇසුරුම් හඳුන්වා දීම ආදි බොහෝ දෑ යෝජනා වී ඇත. මේ සඳහා පාසල් ප්‍රජාවගේ දායකත්වය ලබා ගැනීම ද වඩාත් සඵලදායක වනු ඇත.

(ඊ) උසස් නවකතා පරිශීලනයෙන් ජීවිතාවබෝධය සේ ම රසාස්වාදය ද පෘථුල වේ. ඒ සඳහා බොහෝ නිදර්ශන, දේශීය හා විදේශීය සාහිත්‍යය ඇසුරෙන් සපයා ගත හැකි ය. මෙරටෙහි වසරකට සිංහල නවකතා සියයකට අධික සංඛ්‍යාවක් පළවීමෙන් ප්‍රකට වනුයේ නවකතාව අත්පත් කරගෙන ඇති ජනප්‍රියත්වය යි. මේ ප්‍රමාණාත්මක වර්ධනයට සාපේක්ෂ ව සිංහල නවකතාවේ ගුණාත්මක පක්ෂය ද වර්ධනය විය යුතු බව විචාරක මතය යි.

(ලකුණු 25 යි)

**3.** පහත දැක්වෙන පාඨය වචන **60 - 70** අතර වන සේ **සාරාංශ කොට** ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

සෑම ළමයෙකුට ම ඉගෙනීමට හැකි බවත් එක් එක් ළමයින් ඉගෙන ගන්නේ එක් එක් වේගයෙන් බවත් විවිධත්වයෙන් යුතු විවිධ අයට විවිධ සහාය අවශ්‍ය බවත් අධ්‍යාපන මනෝවිද්‍යාවේ පිළිගැනීම යි. ඒ නිසා ළමයින්ගේ ශාරීරික, බුද්ධිමය, සමාජීය, චිත්තවේගී, භාෂාමය හෝ වෙනත් තත්ත්ව නො සලකා ළමයින් සියලු දෙනාට ම සාමාන්‍ය පාසල්වල ඉගෙනීමට ඉඩපහසුකම් සැලසිය යුතු ය. දුබලතා සහිත ළමයින්, සුභග ළමයින්, නිවසක් නොමැති ළමයින්, දුෂ්කර හෝ ස්ථිර පදිංචි ස්ථානයක් නැති ජනයාගේ ළමයින් සහ වරප්‍රසාද අහිමි වී ඇති හෝ හුදෙකලා වී ඇති ප්‍රදේශවල හෝ කණ්ඩායම්වල ළමයින් මෙයට ඇතුළත් විය යුතු ය.

දුබලතා සහිත සෑම පුද්ගලයෙකුට ම තමාගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් තමාගේ කැමැත්ත ප්‍රකාශ කිරීමට අයිතියක් ඇත. ඉතා දිගු කලක සිට විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ගේ හැකියාවට හා ඵලදායිතාවට වඩා ඔවුන්ගේ ඌනතාවට අවධානය යොමු කරන සමාජය, විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ගේ ප්‍රශ්න ව්‍යාකූල කර ඇත. එනිසා විශේෂ අවශ්‍යතා සහිත ළමයින් සඳහා අන්තර්කරණ පාසල් වශයෙන් හඳුන්වා දෙන සාමාන්‍ය පාසල්වල අධ්‍යාපනය ලබා දීමේ දී පාසලට අභියෝග රාශියකට මුහුණ දීමට සිදු වේ. මේ සඳහා අන්තර්කරණ අධ්‍යාපනය ලබා දීමට ළමයා කේන්ද්‍ර කර ගත් ඉගැන්වීමේ ක්‍රමයක් බිහි විය යුතු ය. එම පාසල මඟින් සෑම ළමයෙකුගේ ම විභව්‍යතා උපරිම මට්ටමට ගෙන එන, උසස් මට්ටමේ අධ්‍යාපනයක් ලබා දීමට සාදරයෙන් ඔවුනොවුන් පිළිගන්නා අන්තර්කරණ සමාජයක් බිහි විය යුතු ය. එවැනි ක්‍රමයක ඉගැන්වීමේ ක්‍රියාවලියේ වේගය හා ස්වභාවය විය යුත්තේ කලින් නියම කළ පිළිවෙළකට ළමයා යොදා ගැනීම නො වේ. ළමයාගේ අවශ්‍යතාවලට ගැළපෙන පරිදි ඉගෙනුම වෙනස් කිරීම යි.

(ලකුණු 10 යි)

[අටවැනි පිටුව බලන්න.

CamScanner

4. පහත දැක්වෙන උද්ධෘතය කියවා අසා ඇති ප්‍රශ්නවලට **කෙටි පිළිතුරු** සපයන්න.

මිනිසා පරිපූර්ණත්වයට පත් කිරීම උදෙසා ඉවහල් වන 'කියවීම' යනු සංකීර්ණ ක්‍රියාවලියකි. මුද්‍රිත පෙළක ඇති වචන හඳුනා ගෙන එයින් කියවෙන අරුත අවබෝධ කර ගැනීම 'කියවීම' ලෙස සරල ව හැඳින්විය හැකි ය. වචන හඳුනා ගැනීම සහ අවබෝධය, කියවීමේ දී සිදු වන ක්‍රියාවලි දෙකකි. භාෂාත්මක සංකේත එහි ශබ්ද හා අනුරූප වන ආකාරය අවබෝධ කර ගැනීමේ ක්‍රියාවලිය වචන හඳුනා ගැනීම ලෙස පැහැදිලි කළ හැකි ය. වචනවල හෝ වාක්‍යවල හෝ සබැඳි පෙළක හෝ අර්ථය තේරුම් ගැනීමේ ක්‍රියාවලිය අවබෝධය යි.

ළමයින්ගේ භාෂා කුසලතා සංවර්ධනය වයස අවුරුදු 2-7 කාලයේ දී සිදු වන බව අධ්‍යාපන මනෝවිද්‍යාඥයෝ පවසති. එබැවින් මුල් ළමාවියේ දී මෙන් ම ප්‍රාථමික අධ්‍යාපන අවධිය ආරම්භයේ දී දරුවන් කියවීමට හුරු කිරීම ආරම්භ කළ යුතු ය. එය සමබර පෞරුෂයකින් යුතු ස්වාධීන කියවන්නකු තැනීමේ අඩිතාලමක් ද වනු ඇත. දරුවන් පොතපතට හුරු කරවීමේ වගකීම දෙමාපියන්ට, ගුරුවරුන්ට මෙන් ම අධ්‍යාපන බලධාරීන්ට ද පැවරී ඇති සුවිශේෂ වගකීමකි.

ප්‍රාථමික පන්තිවල 'කියවීම් කාමර' ආදිය ස්ථාපිත කොට දරුවන් කියවීමේ ක්‍රියාකාරකම් විෂයෙහි යොමු කිරීම සඳහා ගුරුවරුන්ට මග පෙන්විය හැකි ය. ඒ ඒ ශ්‍රේණිවලට යෝග්‍ය වන සේ ළමා සාහිත්‍ය කෘති උපයෝගි කර ගනිමින් ශබ්ද නගා කියවීම, සහකියවීම, මගපෙන්වන ලද කියවීම, ස්වාධීන කියවීම ආදි ක්‍රියාකාරකම් රැසක් ද පාසලේ දී සිදු කළ හැකි ය.

නිසිකලට කියවීමේ කුසලතාව දියුණු කළ විට දරුවන්ට ලැබෙන ප්‍රයෝජන රාශියකි. වාංමාලාව පෝෂණය වීම, ලෝකය පිළිබඳ අවබෝධය පෘථුල වීම, නිර්මාණශීලිත්වය දියුණු වීම, පරිකල්පනය තිව්‍ර වීම, සන්නිවේදන ශක්‍යතා වර්ධනය වීම ඉන් කිහිපයකි.

(i) මෙහි දැක්වෙන පරිදි අවබෝධය යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද?

(ii) කියවීමේ දී සිදු වන ක්‍රියාවලි **දෙක** මොනවා ද?

(iii) දරුවන් කියවීමට හුරු කිරීම ආරම්භ කළ යුත්තේ කුමන අවධිවල දී ද?

(iv) දරුවන්ට කියවීම ප්‍රගුණ කරවීම සඳහා සිදු කළ හැකි ක්‍රියාකාරකම් **දෙකක්** නම් කරන්න.

(v) මෙම පාඨයේ සඳහන් වන පරිදි කියවීමේ කුසලතා දියුණු කිරීමෙන් අත් වන ප්‍රයෝජන **දෙකක්** නම් කරන්න.

(ලකුණු 02 × 5 = 10 යි)

5. ඔබ බිම්මල් වගා කරන්නකු යැයි සිතන්න. ඔබේ බිම්මල් ව්‍යාපාරය සහ බිම්මල් ආශ්‍රිත නිෂ්පාදන ජනතාව අතර ප්‍රචලිත කිරීම සඳහා යෝග්‍ය වෙළෙඳ දැන්වීමක් සකස් කරන්න. බිම්මල් ව්‍යාපාරය සඳහා නමක් ද යොදන්න.

**නැතහොත්**

ඔබේ පාසලේ පැවැත්වෙන අධ්‍යාපනික ප්‍රදර්ශනය සඳහා ප්‍රධාන අමුත්තා වශයෙන් සහභාගි වන මෙන් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා වෙත යවන ආරාධනා පත්‍රය සකස් කරන්න. කලා සංගමයේ ලේකම් උදිත සමරසිංහ ඔබ යැයි සිතන්න. අධ්‍යාපනික ප්‍රදර්ශනය සඳහා සුදුසු නමක් ද යොදන්න

(ලකුණු 15 යි)

❊ ❊ ❊

CamScanner

09672

OL/2023(2024)/21/S-III

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

21 S III

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)

| | | |
|---|---|---|
| සිංහල භාෂාව හා සාහිත්‍යය | III | පැය දෙකයි |
| சிங்களமொழியும் இலக்கியமும் | III | இரண்டு மணித்தியாலம் |
| Sinhala Language and Literature | III | Two hours |

## සිංහල භාෂාව හා සාහිත්‍යය III

වැදගත් : උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් උත්තර සපයන්න.
※ 1, 2, 3, 4 ප්‍රශ්නවලටත්, 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.
මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

**1.** (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර තොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) "කිම, මහරජ, තට බිම්සර මහරජ කුපිත වියැ හො? විසාලා මහනුවර වැසි ලිච්ඡවි රජහු කුපිත වූහ හො? සෙසු ප්‍රතිපක්ෂ රජ කෙනෙක් කුපිත වූහ. හො?"

(අ) මේ ප්‍රකාශය කරනු ලැබුයේ කවුරුන් විසින් ද?

(ආ) මේ ප්‍රකාශය හා සබැඳි අවස්ථාව කුමක් ද?

(ii) නො දැන ම තමා බල
සබයට අවුත් නො පැකිල
**වැද රද පද කමල**
දෙසෙක මුසිලයා ද උන් කල

(අ) තද කළු අකුරින් මුද්‍රිත පද්‍ය පාදයේ අන්තර්ගත කාව්‍යාලංකාරය කුමක් ද?

(ආ) මේ පද්‍යය උපුටා ගත් කෘතිය අයත් වන්නේ කවර අවධියකට ද?

(iii) පහත දැක්වෙන කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

හිරිමල් සිනා රැළි පෙණ පිඩු මිහිරි තම
ගල් පරවල ම හැපි හැපි බිහි කරමි මම

(අ) ......................................................

(ආ) ......................................................

(iv) "කුරක්කන් අඹරන්ඩ අය නැතුවට කන්ඩ අය නම් ඕනෑ තරම් ඉන්නව. මටත් කරන්ඩ තිබුණෙ අර වී ඇටය අහුලපු කිකිළි කරපු දේ"

(අ) මේ ප්‍රකාශය ඇතුළත් නිර්මාණයේ කතුවරයා කවරෙක් ද?

(ආ) එම කතුවරයාගේ මුල් ම කෙටිකතා සංග්‍රහයේ නම කුමක් ද?

(v) "ඇයට තමා හා එකට ඉගෙන ගත් මිතුරියක් සිටියා ය. මිතුරිය බැලීමට ගොස් පෙරළා ආ සෑම විටෙක ම ඇ බලවත් චිත්ත සන්තාපයට හා දුක් වේදනාවකට භාජන වූවා ය."

(අ) මේ ප්‍රකාශය උපුටා ගෙන ඇති නිර්මාණයේ නම ලියන්න.

(ආ) මෙහි සඳහන් තැනැත්තිය චිත්ත සන්තාපයට පත්වීමට හේතුව කුමක් ද?

(vi) (අ) 'අමාවතුර' කෘතිය රචනා කොට ඇත්තේ බුදුරජාණන් වහන්සේගේ කුමන ගුණයක් පාදක කර ගෙන ද?

(ආ) මේ කෘතිය රචනා වූ කාලය ලෙස පිළිගැනෙන්නේ කුමන අවධිය ද?

(vii) කුළින් කුළම සිහිල් ඹ වැහෙන කඳුරුය
දොළින් දොළම කල් යල් කරන කුඹුරුය
පළින් පළම තල් පොල් ගෙ වතු මැඳුරුය
තළින් තළම පුල් පියුම් පුල පඬුරුය

(අ) ඉහත සඳහන් කවිය ඇතුළත් කාව්‍ය ග්‍රන්ථයේ නම කුමක් ද?

(ආ) සිතල ජලය යන්න සඳහා ඉහත කවියේ යෙදී ඇති වචනය කුමක් ද?

[දෙවැනි පිටුව බලන්න.

CamScanner

(viii) සැඟවෙමි - එබෙමි - නිසසල වෙමි - සසල වෙමි
ඇඹරෙමි - එහෙත් පසු නොබසිමි - නොනවතිමි
(අ) මේ පද්‍ය ඛණ්ඩය ඇතුළත් කාව්‍ය නිර්මාණයේ නම ලියන්න.
(ආ) පද්‍ය පාද දෙකෙන් මතු කෙරෙන ශබ්දාලංකාරය කුමක් ද?

(ix) "මෙ ගම දැන් හොල්මන් අධිකෝඩ පිරුණු යකුන් අරක්ගත් කාලකණ්ණි ගමකි. ළමයින් හා මහල්ලන් ද නැසී යන්නාක් මෙන් ගමත් දැන් නැසී යයි."
(අ) මේ ප්‍රකාශය කරනු ලැබුයේ කවුරුන් විසින් ද?
(ආ) මේ පාඨය උපුටා ගත් කෘතියේ නම කුමක් ද?

(x) එල්ල වෙන්ට කවි කර කිවෙමි බොහොම
කොල්ල කන්ට එති සිවුපාවෝ බොහොම
ගොල්ල සමග එති ඌරෝ සැමදාම
නිල්ල අඹති සත් දවසින් බැලුවාම
(අ) මේ පද්‍යය ඇතුළත් පාඨමේ නම ලියන්න.
(ආ) මේ පද්‍යය අයත් වන්නේ කුමන කාව්‍ය වර්ගයකට ද?

(ලකුණු 02 × 10 = 20 යි)

**2.** පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) **පටන්** සුරිඳු දුන් උපදෙස් සිහි කොට
**ඉටන්** බෙලෙන් දැමුවෙන් ගුළි අහසට
තුටන් වඩන සුර අඟනෝ බැස සිට
පටන් ගත්තු නව සියයක් නැටුමට
(අ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙන ම ලියන්න.
(ආ) මුළු පද්‍යයේ ම අදහස සරල බසින් ලියන්න.

(ii) "දර පලා සඳහා **වල් යන්නාහු** නැති. ඊ ගමට වැද පයින් පැහැරැ දොර ගලවා-පියා එහි හොතුවන් මරා-පියා 'එකෙකැ දෙකෙකැ' යි ගැණැගෙන-යෙයි. එ කල්හි ගම්වැස්සො ගම පියා ගොස් නියම්ගම් වන්හ. නියම්ගම්වැස්සො ගොස් නුවර වන්හු. තුන් යොජනක් තන්හි මිනිස්හු ගෙ පියා දරුවන් අතැ ගෙනැ ගොස් සැවැත් නුවර වටා කඳවුරු බැඳැ **රාජාඞගණයෙහි** රැස් වැ "මහරජ, තා ගෙ රට අඞගුලිමාල නම් සොරෙක් වි යැ" කිය කියා වලපිත්."
(අ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.
(ආ) අඟුල්මල් නිසා බියට පත් ජනතාව හැසුරුණු ආකාරය කෙටියෙන් දක්වන්න.

(iii) **දිමුත්** වෙහෙර වට විසිතුරු මල් වතු ය
එහිත් සුවඳ මල් නිති වෙයි මිණි මුතු ය
**මගත් තුරු** මියුරු පල ගෙන නැමි අතු ය
රැගත් සෙවණ නො හැරම සිටි පොල් වතු ය
(අ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.
(ආ) කවියා, විහාරය ආශ්‍රිත පරිසරයේ විචිත්‍රත්වය වර්ණනා කර ඇති අයුරු කෙටියෙන් ලියන්න.

(iv) නිමල් සඳ පහන් වැනි වැලි පිට උදුළ
සුපුල් මල් යහන් ලිය මඬු ලිය ගෙ පෙළ
එකල් කෙළන වන දෙව් ලිය දැක කොමළ
ළසල් රුකෙක සැතපෙව ළපඳු සිහල'ළ
(අ) මේ පද්‍යයේ අන්තර්ගත උපමාව සහ උපමේය වෙන් කොට දක්වන්න.
(ආ) කවියා සැළලිහිණියාට විවේක ගන්නට යැයි පවසන්නේ කුමන දේවල් නැරඹීමෙන් අනතුරු ව ද?

[තුන්වැනි පිටුව බලන්න.

0000657

Downloaded from Past Papers Wiki - Extensive collection of Past papers, Notes and much more! CamScanner

(v) "ඒ ගිරා පණ්ඩිතයන්ගේ මෙ බඳු වතෙක් ඇත්තේ ය. ඉදින් කිසි තෙනෙකින් ගෙනා හස්නක් පණ්ඩිතයන් වහන්සේට පමණක් කිය යුතු වී නම් උන් වහන්සේගේ **දසරුවට** බස්නාහ; ඉදින් අමරා දේවීනුත් ඇසුව මනා වී නම් **ඇකයෙහි** ගොස් හිඳිනාහ; ඉදින් බොහෝ දෙනා ඇසුව මනා වී නම් බිමට බස්නාහ. එදවස් ගිරා පණ්ඩිතයෝ පණ්ඩිතයන් වහන්සේගේ දසරුවෙහි බැස උන්හ. ඒ සලකුණෙන්, 'රහසැ බිණිය යුතු යැ' යි අමරා දේවීන් හා බොහෝ දෙන ඉවත් ව ගියහ."

(අ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(ආ) හස්නක් ප්‍රකාශ කිරීමේ දී ගිරා පණ්ඩිතයන් අනුගමනය කළ ක්‍රියා පිළිවෙත කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 04 × 5 = 20 යි)

3. මහෞෂධ පඬිතුමා සතු ව තිබූ,

- ස්ථානෝචිත ප්‍රඥාවත්
- කාර්ය සංවිධානයත්

යුද්ධ ජයග්‍රහණය සඳහා යොදා ගත් ආකාරය උම්මග්ග ජාතකයේ විස්තර කෙරෙනුයේ පාඨක සිත් ඇද බැඳ ගන්නා ආකාරයෙනි.

නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

**නැතහොත්**

වීණා වාදනයේ මිහිරි බව කියා පෑමට,

- සුරඟන රඟුමත්
- අවට රැස්වූවන්ගේ ස්වභාවයත්

උචිත සේ ගැළපීමට ගුත්තිල කතු හිමියන් දැක්වූ කුසලතාව නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් ඉදිරිපත් කරමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි)

4.
- අතීත ශ්‍රී විභූතියත්
- අනාගත සමෘද්ධියත්

අපූර්ව ලෙස සංකලනය කිරීමට කවියා සමත් වී තිබීම 'දෑතේ කරගැට සිඟ සනසන්නට' කාව්‍ය නිර්මාණයේ සාර්ථකත්වයට හේතු වී ඇත.

එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විස්තර කරන්න.

**නැතහොත්**

- උචිත අවස්ථා යොදා ගැනීමත්
- සිද්ධි ගැළපීමත්

'අපට වැසිකිළියක්' කෙටිකතාව පාඨක සිත් ගැනීමට හේතු වී ඇත.

එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විස්තර කරන්න.

(ලකුණු 15 යි)

- 5, 6, 7 ප්‍රශ්නවලින් **එකකට** පමණක් උත්තර ලියන්න.

5. 'සිංහබාහු' යනු වත්මන් තරුණ පරපුරේ සිතුම් පැතුම් නියෝජනය කෙරෙන චරිතයකි. නිර්දිෂ්ට නාට්‍ය පෙළ ඇසුරෙන් උදාහරණ **තුනක්වත්** දක්වමින් විමසන්න. (ලකුණු 10 යි)

6. කථා රසය උද්දීපනය වන අයුරින් සිද්ධි පෙළගැස්වීමේ දී කතුවරයා දක්වා ඇති කුසලතාව 'උග්ගසේන නම් සිටුපුත්හුගේ වස්තුව' ඇසුරෙන් උදාහරණ **තුනක්වත්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි)

7. 'ජාතික තොටිල්ල' කවිපෙළේ සාර්ථකත්වයට උපයුක්ත භාෂා ශෛලියේ සුලලිත බව හේතු වී ඇත. නිර්දිෂ්ට කවි පෙළ ඇසුරෙන් උදාහරණ **තුනක්වත්** දක්වමින් විමසන්න. (ලකුණු 10 යි)

***

PAST PAPERS WIKI

(11) WWW.PastPapers.WiKi (11)

Downloaded from Past Papers Wiki - Extensive collection of Past papers, Notes and much more! CamScanner

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

රහස්‍යයි

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023(2024)
## க.பொ.த. (சா.தர)ப் பரீட்சை - 2023(2024)

| විෂය අංකය<br>பாட இலக்கம் | 21 | විෂයය<br>பாடம் | සිංහල භාෂාව හා සාහිත්‍යය I |
|---|---|---|---|

### I පත්‍රය - පිළිතුරු
### I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරෙහි අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරෙහි අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරෙහි අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරෙහි අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 2 | 11. | 3 | 21. | 2 | 31. | 1 |
| 02. | 1 | 12. | 1 | 22. | 1 | 32. | 4 |
| 03. | 4 | 13. | 2 | 23. | 3 | 33. | 4 |
| 04. | 2 | 14. | 4 | 24. | 1 | 34. | 2 |
| 05. | 2 | 15. | All | 25. | 3 | 35. | 1 |
| 06. | 4 | 16. | 4 | 26. | 3 | 36. | 2 |
| 07. | 3 | 17. | 1 | 27. | 4 | 37. | 4 |
| 08. | 2 | 18. | 3 | 28. | 3 | 38. | 1 |
| 09. | 4 | 19. | 2 | 29. | 4 | 39. | 4 |
| 10. | 1 | 20. | 1 | 30. | 2 | 40. | 3 |

* 15 - ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයා නොතිබුණ ද ලකුණු පිරිනමන්න.

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින் / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை: $\frac{25}{40}$

I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி: $\frac{25}{40}$



CamScanner

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය
# II පත්‍රය

**ප්‍රශ්න අංකය 01**

**අපේක්ෂණය** - **භාෂා පරිචය ඇගයීම**

මෙම ප්‍රශ්නයට කෙටි උත්තර අපේක්ෂිත අනුප්‍රශ්න දහයක් ඇතුළත් වේ. අනුප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ලකුණු 20කි.

ඉගෙනුම් පල -

- සඤ්ඤක අකුරු හඳුනා ගෙන නිවැරදි ව භාවිත කරයි.
- අන්තඃස්ථාක්ෂර නිවැරදි ව හඳුනා ගෙන භාවිත කරයි.
- අක්ෂර වින්‍යාසය පිළිබඳ රීති අනුගමනය කරමින් ලියයි.
- පොතපත කියවීමෙන් පුළුල් කර ගත් වාක්කෝෂය භාෂා කාර්යයේ දී භාවිත කරයි.
- සාම්ප්‍රදායික යෙදුම් හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- අවබෝධයෙන් යුතු ව සමාස පද භාවිත කරයි.
- සම්මත රීති අනුගමනය කරමින් වාක්‍ය ලියයි.
- ක්‍රියා පද හඳුනා ගෙන නම් කරයි.
- කර්තෘ කාරක හා කර්ම කාරක වාක්‍ය රීති අනුගමනය කරමින් නිවැරදි ව ලේඛනයේ යෙදෙයි.
- වාක්‍ය රීති පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.

**1.** (i) සිට (x) තෙක් ඇති **සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) **සිංහල අක්ෂරමාලාවේ ඇතුළත්**

(අ) **සඤ්ඤක අක්ෂරයක් ලියා දක්වන්න.**

(ආ) **අන්තඃස්ථාක්ෂරයක් ලියා දක්වන්න.**

(අ) ඟ, ඦ, ඬ, ඳ, ඹ

(ආ) ය, ර, ල, ව

(ii) **පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.**

**"එම සිද්දිය පිළිබඳ තොරතුරු ගවේෂණය කළ විමර්ශන නිළධාරීහු එකී තොරතුරු අධිකරණය වෙත වාර්තා කළහ."**

සිද්ධිය, නිලධාරීහු

(iii) **පහත සඳහන් පදවලට විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.**

(අ) **කීර්තිය** (ආ) **සුසිරිත**

(අ) අපකීර්තිය (ආ) දුසිරිත

(iv) පහත සඳහන් අදහස්වලට ගැළපෙන තනි පද ලියන්න.

(අ) තනි ව හැසිරෙන (ආ) සමාන හදවතක් ඇති

(අ) ඒකචාරී, එකසර (ආ) සහෘද

(v) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් සමාස පද දෙක ලියන්න.

"උපසභාපතිතුමා කළ ප්‍රකාශය නිවැරදි නොවන බව පැමිණ සිටි සාමාජිකයන්ගෙන් බහුතරයක් දෙනා එක හඬින් ප්‍රකාශ කළහ."

උපසභාපති, නිවැරදි

(vi) පහත සඳහන් වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර නැවත ලියන්න.

(අ) සිංහයෝ මෙන් සැරසුණු දරුවෝ ජාතික ධජ ඔසවමින් ක්‍රීඩකයන් දිරිගැන්වූහ.

(ආ) සාහිත්‍ය සංගමයේ සාමාජිකයෝ හෙවත් සිසුන් විවිධ නිර්මාණ ඉදිරිපත් කළහ.

(අ) සිංහයන් මෙන් සැරසුණු දරුවෝ ජාතික ධජ ඔසවමින් ක්‍රීඩකයන් දිරිගැන්වූහ.

(ආ) සාහිත්‍ය සංගමයේ සාමාජිකයෝ හෙවත් සිසුහු විවිධ නිර්මාණ ඉදිරිපත් කළහ .

(vii) 'මහා මාර්ගවල ගමනාගමනයේ යෙදෙන ඇතැම් රියැදුරන් සිත්පිත් නැත්තන් සේ ක්‍රියා කිරීම රිය අනතුරුවලට ප්‍රධාන හේතුවකි' යන වාක්‍යයේ ඇතුළත් යුගල පදයක් හා විශේෂණ පදයක් ලියන්න.

යුගල පදය - සිත්පිත්

විශේෂණ පදය - මහා මාර්ගවල, ඇතැම් රියැදුරන්, රිය අනතුරුවලට

(viii) පහත සඳහන් යෙදුම්වල පළමුවන වචනය සමග දෙවන වචනයේ නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන ලෙස පළමුවන වචනය හෝ දෙවන වචනය සකස් කර ලියන්න.

(අ) චන්ද්‍ර මඬල (ආ) සොබා ධර්මය

(අ) චන්ද්‍ර මණ්ඩලය - සඳ මඬල (ආ ) සොබා දහම / සොබා දම / ස්වභාව ධර්මය

(ix) පහත සඳහන් වාක්‍යවල ඇති තද කළු අකුරින් මුද්‍රිත පද කවර ක්‍රියා ප්‍රවර්ගයට අයත් වේ ද?

(අ) නොනැවතී ඉදිරියට ම **යවු.**

(ආ) හිරු **බසිත** කෙමෙන් කෙමෙන් සඳ අහසට නැගෙයි.

(අ) විධි ක්‍රියා / විදි කිරිය

(ආ) අසම්භාව්‍ය ක්‍රියා / අසබභව් කිරිය (කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා)

(x) පහත සඳහන් වාක්‍ය කර්තෘකාරකයට හරවා ලියන්න.

(අ) දේශප්‍රේමීන් විසින් දේශය ආරක්ෂා කරනු ලබයි.

(ආ) ගුරුවරුන් විසින් නිරන්තරයෙන් ශිෂ්‍යයෝ යහමගට යොමු කෙරෙති.

(ලකුණු 02 × 10 = 20 යි)

(අ) දේශප්‍රේමීහු / දේශප්‍රේමියෝ දේශය ආරක්ෂා කරති.

(ආ) ගුරුවරු නිරන්තරයෙන් ශිෂ්‍යයන් යහමගට යොමු කරති.



CamScanner

**ප්‍රශ්න අංකය 02**

අපේක්ෂණය - විශ්ලේෂණ හැකියාව මැනීම

මේ ප්‍රශ්නය සැකසීමේ දී අනුගමනය කර ඇත්තේ මාර්ගෝපදේශිත රචනා මූලධර්මය යි. එනම් ඉදිරිපත් කොට ඇති මග පෙන්වීම ප්‍රයෝජනයට ගනිමින් කිසියම් රචනාවක් ලිවීමට අපේක්ෂකයාට ඉඩ සැලැස්වීම යි. රචනයේ ඇතුළත් විය යුතු කරුණු, විස්තරය ඇසුරෙන් වටහා ගත යුතු ය. රචනයෙහි අන්තර්ගත විය යුතු ඡේද සංඛ්‍යාව ගැන වැටහීමක් දී ඇති විස්තරයෙන් ලබා ගත හැකි ය. මාතෘකාව ඉදිරිපත් කොට නැතත්, ඉදිරිපත් කොට ඇති විස්තර ඇසුරෙන් අපේක්ෂකයා මාතෘකාව සකස් කර ගත යුතු ය.

ඉගෙනුම් පල -

- රචනා මාතෘකාවට අදාළ ව කරුණු රැස් කරයි.
- රැස් කර ගත් කරුණු තර්කානුකූල ව පෙළගස්වයි.
- ශිල්පීය දක්ෂතා අනුගමනය කරමින් රචනා ලියයි.
- නිර්මාණාත්මක ලේඛනයේ යෙදෙයි.

**2.** **පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යත විස්තර අතුරෙන් එකක් තෝරා ගෙන වචන 250කට නො අඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.**

**(අ)** සුළු වර්ෂාවක දී පවා මෙරටෙහි ඇතැම් නගර ජලයෙන් පිරියනු නිබඳ ව දැකිය හැකි ය. එම නිසා නාගරික ජනතාවට ආපදා රැසකට මුහුණ දීමට සිදු වී ඇති අතර ඒවා එදිනෙදා ජන ජීවිතයට ද අහිතකර ලෙස බල පා ඇත. පරිසර හිතකාමී යහපත් මානව චර්යා හැඩගස්වා ගැනීම සහ විධිමත් නගර සැලසුම්කරණය මගින් මෙම ගැටලුව සඳහා විසඳුම් ලබා ගැනීම උචිත ය. ඒ වෙනුවෙන් අදාළ වගකිව යුතු ආයතනවල සහ පුද්ගලයන්ගේ අවධානය හා සක්‍රිය දායකත්වය ද නොමඳ ව ලැබිය යුතු ය.

- **විධිමත් නගර සැලසුම්කරණයක අවශ්‍යතාව**
- **පරිසර හිතකාමී නගර සැලසුම්කරණයක අවශ්‍යතාව**

**(ආ)** වයස් භේදයකින් තොරව වර්තමානය වන විට බොහෝ දෙනා 'සමාජ මාධ්‍ය' ඇසුරු කරති. නිවැරදි තොරතුරු හුවමාරු කර ගැනීම, දැනුම ලබා ගැනීම, එකිනෙකා අතර යහපත් සම්බන්ධතා ඇති කර ගැනීම ආදි ප්‍රයෝජන රැසක් මෙමගින් ලබා ගත හැකි ය. එසේ වුවත් සමාජ මාධ්‍ය අවභාවිත කිරීම නිසා ඇතැම් විට පැන නැගෙන ගැටලු සමාජයට හිතකර නො වේ. එම නිසා සමාජ මාධ්‍ය භාවිතයේ දී පරිශීලකයන්ගේ 'ස්වයං නියාමනය' අත්‍යවශ්‍ය බව නිරතුරු ව අවධාරණය කෙරේ.

- **සමාජ මාධ්‍ය භාවිතයේ දී ස්වයං නියාමනයක අවශ්‍යතාව**
- **ස්වයං නියාමනය මගින් සමාජ මාධ්‍ය අවභාවිතය වැළැක්වීම**

**(ඉ)** ලෝක පරිසර සංවිධානවල දැඩි අවධානයට ලක් වී ඇති 'ප්ලාස්ටික් අපද්‍රව්‍ය' සම්බන්ධ ගැටලුව, ශ්‍රී ලංකාවට ද ප්‍රබල තර්ජනයක් වී ඇත. අවිධිමත් ලෙස පරිසරය වෙත මුදා හැරෙන මේ අපද්‍රව්‍ය කඳු, බොහෝ සෞඛ්‍ය හා පාරිසරික ගැටලුවලට මූලික වී ඇත. එම ගැටලුවලට පිළියම් ලෙස පරිසර නීති බලාත්මක කිරීම, ප්ලාස්ටික් දූෂණයේ අහිතකර බලපෑම් පිළිබඳ ජනතාව දැනුවත් කිරීම, අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය, පරිසර හිතකාමී ඇසුරුම් හඳුන්වා දීම ආදි බොහෝ දෑ යෝජනා වී ඇත. මේ සඳහා පාසල් ප්‍රජාවගේ දායකත්වය ලබා ගැනීම ද වඩාත් සඵලදායක වනු ඇත.

- **පරිසර දූෂණය වැළැක්වීම සඳහා ප්‍රතිචක්‍රීකරණයේ වැදගත්කම**
- **අවිධිමත් ලෙස අපද්‍රව්‍ය පරිසරයට මුදා හැරීමේ ආදීනව**

**(ඊ)** උසස් නවකතා පරිශීලනයෙන් ජීවිතාවබෝධය සේ ම රසාස්වාදය ද පෘථුල වේ. ඒ සඳහා බොහෝ නිදර්ශන, දේශීය හා විදේශීය සාහිත්‍යය ඇසුරෙන් සපයා ගත හැකි ය. මෙරටෙහි වසරකට සිංහල නවකතා සියයකට අධික සංඛ්‍යාවක් පළවීමෙන් ප්‍රකට වනුයේ නවකතාව අත්පත් කරගෙන ඇති ජනප්‍රියත්වය යි. මේ ප්‍රමාණාත්මක වර්ධනයට සාපේක්ෂ ව සිංහල නවකතාවේ ගුණාත්මක පක්ෂය ද වර්ධනය විය යුතු බව විචාරක මතය යි.

(ලකුණු 25 යි)

- **සිංහල නවකතාවේ ගුණාත්මක පක්ෂය වර්ධනය කිරීමේ අවශ්‍යතාව**
- **ගුණාත්මක නවකතා පරිශීලනය කිරීමේ වැදගත්කම**



CamScanner

**ලකුණු විග්‍රහය - මුළු ලකුණු 25යි.**

01. සාරවත්භාවය, මාතෘකාව ද ඇතුළු ව - ලකුණු 08 යි.
02. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය - ලකුණු 12 යි.
03. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම - ලකුණු 05 යි.

01. සාරවත්භාවය - ලකුණු 07 යි.
විස්තරයට අදාළ වන පරිදි මාතෘකාවක් යොදා තිබීම - ලකුණු 01 යි.

තේමාවට අදාළ බව, ඉදිරිපත් කොට ඇති ව්‍යුහයට සමීපබව, සරුබව හා සමබව, වචන ගණන 250 සමීප ව පැවතීම යන කරුණු සාරවත්භාවය යටතේ සැලකිල්ලට ගත යුතු වේ.

02. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය - ලකුණු 12 යි.
මෙහි දී උසස් ප්‍රකාශන ශක්තිය, සංවිධානය, ස්වීයත්වය, නිර්මාණාත්මක ප්‍රකාශනය, ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය ආදි අංශ ගැන සලකා බැලිය යුතු ය.

03. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම - ලකුණු 05 යි.
වියරණ, අත්අකුරු, විරාම ලක්ෂණ භාවිතය, ඡේද අදාළ පරිදි වෙන් කොට තිබීම, පද වෙන් කොට ලිවීම යන අංශ ගැන සලකා බලා ලකුණු තීරණය කළ යුතු වේ.

❖ **සැලකිය යුතු යි.**

01. රචනයේ වචන ගණන දළ වශයෙන් 200ට වඩා අඩු වන කල්හි ඉහත දක්වූ 1, 2, 3 යන කොටස්වලට ආනුපාතික ව ලකුණක් තීරණය කළ යුතු වේ.
02. වැදගත් අදහස්, සිත් ගන්නා ප්‍රකාශන ඇති තැන්වල (✓) යොදන්න. වැරදි තැන්වල (x) ලකුණු යොදන්න.
03. උක්තාඛ්‍යාත සම්බන්ධ වැරදි තැන් යටින් ඉරක් අඳින්න. අක්ෂර වින්‍යාසය වැරදි වචන වටා රවුමක් අඳින්න.
1, 2, 3 යන කොටස් සඳහා දෙන ලද ලකුණු උත්තරය අග හරස් අතට ලියා එකතු කර, මුළු ලකුණු ගණන ලබා ගන්න.

නිදසුන් - $\frac{6}{8}$ $\frac{9}{12}$ $\frac{3}{5}$ $\frac{18}{25}$

සංලක්ෂය - ★ වාක්‍ය රචනා ඇගයීමට පෙර අදාළ ව්‍යුහය කියවා දළ සැලැස්මක් සකස් කර ගන්න. ව්‍යුහයට කිසිසේත් අදාළ නොවන සේ ලියා ඇති රචනා ඇගයීමේ දී සාරවත්භාවය සඳහා පිරිනැමිය යුත්තේ ඉතා අඩු ලකුණකි.

රචනය දුර්වල වුවත් මුළු ලකුණු වශයෙන් බින්දුව නො දෙන්න. සමස්තයක් ලෙස සලකා ලකුණු 02 - 05 අතර සංඛ්‍යාවක් පිරිනමන්න. උපරිම ලකුණු 05 ඉක්මවිය යුතු නො වේ.

සාරවත්භාවය මාතෘකාව ද ඇතුළු ව - ලකුණු 08

| | |
|---|---|
| මාතෘකාව ද සහිත ව සාරවත් කරුණු ප්‍රමාණවත් ව ඉදිරිපත් කිරීම, මාතෘකාව රචනාවට ගැළපෙන බව, මනා භාෂා භාවිතය, තේමාවට අදාළ ව ලියා තිබීම, සරුබව හා සමබව නිවැරදි ව රැක තිබීම, වචන 250ට සමීප ව පැවතීම. | 8-7 |
| සාරවත් කරුණු කිහිපයක් පමණක් ඉදිරිපත් කිරීම, මාතෘකාව ද රචනාවට ගැළපෙන පරිදි යොදා තිබීම, භාෂා ශෛලිය තරමක් හොඳින් පැවතීම, තේමාවට අදාළ බව තරමක් දුරස්වීම, සමබවෙහි හා සරුබවෙහි තරමක් දුර්වලතා පැවතීම, වචන ගණන 200ට වඩා අඩුවීම. | 6-5 |
| සාරවත් කරුණු ප්‍රමාණවත් පරිදි නොතිබීම, භාෂා ශෛලියේ දුර්වලතා පැවතීම, තේමාවට අදාළ නොවීම, මාතෘකාවක් යොදා තිබීම, සරුබව හා සමබව නොපැවතීම, වචන ගණන 200ට අඩුවීම. | ලකුණු 4ට අඩු |



CamScanner

සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය - ලකුණු 12

| | |
|---|---|
| උසස් ප්‍රකාශන ශක්තිය, මැනවින් කරුණු සංවිධානය කර තිබීම, ස්වීයත්වය ප්‍රදර්ශනය කිරීම, නිර්මාණාත්මක ව ලියා තිබීම, නිරවුල් බව, ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය භාවිත කිරීම. | 12-10 |
| ප්‍රකාශන ශක්තියෙහි දුර්වලතා තරමක් පැවතීම, කරුණු සංවිධානයේ දී දුර්වලතා තරමක් පැවතීම. | 9-7 |
| ප්‍රකාශන ශක්තියෙහි දුර්වලතා තරමක් පැවතීම, කරුණු සංවිධානය කර ගැනීමේ දී දුර්වලතා දක්නට ලැබීම,<br>ස්වීයත්වයෙහි ගැටලු දක්නට ලැබීම,<br>නිර්මාණාත්මක ව කරුණු ඉදිරිපත් කිරීමේ ගැටලු පැවතීම,<br>භාෂා ව්‍යවහාරයෙහි දුර්වලතා පැවතීම. | 6-4 |
| ප්‍රකාශන ශක්තියෙහි බොහෝ දුර්වලතා පැවතීම<br>කරුණු සංවිධානය කර ගැනීමේ දී බොහෝ දුර්වලතා දක්නට ලැබීම,<br>ස්වීයත්වය ප්‍රදර්ශනය නොකිරීම,<br>නිර්මාණාත්මකභාවය දක්නට නොලැබීම,<br>නිරවුල් නොමැතිවීම,<br>භාෂා ව්‍යවහාරයේ බොහෝ දුර්වලතා පැවතීම. | 3-1 |

ශිල්පීය දක්ෂතා - ලකුණු 05

| | |
|---|---|
| ව්‍යාකරණ රීති නිවැරදි ව අනුගමනය කර තිබීම,<br>පැහැදිලි අත්අකුරු භාවිත කිරීම,<br>විරාම ලක්ෂණ නිවැරදි ව භාවිත කිරීම,<br>නිවැරදි ඡේද වෙන් කිරීම,<br>අක්ෂර වින්‍යාස රීති භාවිතය. | 5 |
| ව්‍යාකරණ දෝෂ, අපැහැදිලි අත්අකුරු, විරාම ලක්ෂණමය දෝෂ, අක්ෂර දෝෂ තරමක් පැවතීම. | 4-3 |
| ඉහත දෝෂ බහුල වීම. | 1 |



CamScanner

**ප්‍රශ්න අංකය 03**

**අපේක්ෂණය** - කිසියම් කොටසක් කියවා, විස්තර වර්ණනා බැහැර කරමින්, එහි හරය වටහා ගෙන, ඒ ඇසුරින් සමස්ත අර්ථය තම වචනයෙන් ඉදිරිපත් කිරීමේ හැකියාව මෙහි දී ඇගයේ. ඒ අනුව සංශ්ලේෂණ හැකියාව මෙහි ලා විමසීමට ලක් කෙරේ.

ඉගෙනුම් පල -

- ලිපි ලේඛනවලින් වැදගත් කරුණු වෙන් කොට දක්වයි.
- වැදගත් කරුණු අර්ථවත් ව ගළපා ඉදිරිපත් කරයි.
- මුල් ලේඛනයේ අදහස් ආරක්ෂා වන පරිදි සාරාංශ කර දක්වයි.

**3. පහත දැක්වෙන පාඨය වචන 60 - 70 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.**

**සැම ළමයෙකුට ම ඉගෙනීමට හැකි බවත් එක් එක් ළමයින් ඉගෙන ගන්නේ එක් එක් වේගයෙන් බවත් විවිධත්වයෙන් යුතු විවිධ අයට විවිධ සහාය අවශ්‍ය බවත් අධ්‍යාපන මනෝවිද්‍යාවේ පිළිගැනීම යි. ඒ නිසා ළමයින්ගේ ශාරීරික, බුද්ධිමය, සමාජීය, චිත්තවේගී, භාෂාමය හෝ වෙනත් තත්ත්ව නො සලකා ළමයින් සියලු දෙනාට ම සාමාන්‍ය පාසල්වල ඉගෙනීමට ඉඩපහසුකම් සැලසිය යුතු ය. දුබලතා සහිත ළමයින්, සුහග ළමයින්, නිවසක් නොමැති ළමයින්, දුෂ්කර හෝ ස්ථිර පදිංචි ස්ථානයක් නැති ජනයාගේ ළමයින් සහ වරප්‍රසාද අහිමි වී ඇති හෝ හුදෙකලා වී ඇති ප්‍රදේශවල හෝ කණ්ඩායම්වල ළමයින් මෙයට ඇතුළත් විය යුතු ය.**

**දුබලතා සහිත සැම පුද්ගලයෙකුට ම තමාගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් තමාගේ කැමැත්ත ප්‍රකාශ කිරීමට අයිතියක් ඇත. ඉතා දිගු කලක සිට විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ගේ හැකියාවට හා ඵලදායිතාවට වඩා ඔවුන්ගේ ඌනතාවට අවධානය යොමු කරන සමාජය, විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ගේ ප්‍රශ්න ව්‍යාකූල කර ඇත. එනිසා විශේෂ අවශ්‍යතා සහිත ළමයින් සඳහා අන්තර්කරණ පාසල් වශයෙන් හඳුන්වා දෙන සාමාන්‍ය පාසල්වල අධ්‍යාපනය ලබා දීමේ දී පාසලට අභියෝග රාශියකට මුහුණ දීමට සිදු වේ. මේ සඳහා අන්තර්කරණ අධ්‍යාපනය ලබා දීමට ළමයා කේන්ද්‍ර කර ගත් ඉගැන්වීමේ ක්‍රමයක් බිහි විය යුතු ය. එම පාසල මගින් සැම ළමයෙකුගේ ම විභව්‍යතා උපරිම මට්ටමට ගෙන එන, උසස් මට්ටමේ අධ්‍යාපනයක් ලබා දීමට සාදරයෙන් ඔවුනොවුන් පිළිගන්නා අන්තර්කරණ සමාජයක් බිහි විය යුතු ය. එවැනි ක්‍රමයක ඉගැන්වීමේ ක්‍රියාවලියේ වේගය හා ස්වභාවය විය යුත්තේ කලින් නියම කළ පිළිවෙළකට ළමයා යොදා ගැනීම නො වේ. ළමයාගේ අවශ්‍යතාවලට ගැළපෙන පරිදි ඉගෙනුම වෙනස් කිරීම යි.**

(ලකුණු 10 යි)

සාරාංශකරණය :

අන්තර්ගතය

- සැම ළමයකුට ම ඉගෙනීමට හැකි ය.
- ළමයින්ගේ ඉගෙනීමේ හැකියාව විවිධාකාර බව අධ්‍යාපන මනෝවිද්‍යාවේ පිළිගැනීම යි.
- සියලු ළමයින්ට ම සාමාන්‍ය පාසල්වල ඉගෙනීමට ඉඩ සැලසිය යුතු ය.
- දුබලතා සහිත ළමයින්ගේ හැකියාවට හා ඵලදායිතාවට වඩා ඌනතාවට අවධානය යොමු කිරීමෙන් ප්‍රශ්න ව්‍යාකූල වී ඇත.
- අන්තර්කරණ අධ්‍යාපනය ලබා දීමේ දී ද ළමයා කේන්ද්‍ර කර ගත් අධ්‍යාපන ක්‍රමයක් අවශ්‍ය ය.
- අන්තර්කරණයේ කලින් නියම කළ පිළිවෙළකට නොව ළමයාගේ අවශ්‍යතාවලට ගැළපෙන පරිදි ඉගෙනුම වෙනස් කළ යුතු ය.



CamScanner

**සාරාංශකරණය:**

**මුළු ලකුණු ප්‍රමාණය 10 යි.**

**ලකුණු විග්‍රහය:**

| | | | |
|---|---|---|---|
| 01. | අන්තර්ගතය | - | ලකුණු 06 යි. |
| 02. | වචන ගණන | - | ලකුණු 02 යි. |
| 03. | ශිල්පීය දක්ෂතා | - | ලකුණු 02 යි. |

* වචන ගණන 75 ඉක්මවන කල්හි මුල් වචන 70 පමණක් ඇගයීමට ලක් කරන්න.
* වචන ගණන 55ට අඩු කල්හි එහි ඇතුළත් අදහස් පමණක් සැලකිල්ලට ගෙන ලකුණු පිරිනමන්න.
* ඡේද බෙදා තිබුණහොත් ශිල්පීය දක්ෂතා කොටසින් ලකුණක් අඩු කරන්න.
* එක යට එක අසම්බන්ධිත වාක්‍ය ලෙස ලියා ඇත්නම් අන්තර්ගතයට දිය හැකි උපරිම ලකුණු ගණන 02කි.
* වචන ගණන 75ට වැඩි කල්හි හෝ 55ට අඩු කල්හි ලකුණක් අඩු කරන්න.
* දුර්වල සාරාංශ සඳහා බින්දුව නො දී ලකුණු 03ක උපරිමයකට යටත් ව ලකුණු පිරිනමන්න.

සාරාංශයේ අන්තර්ගතය සඳහා ලකුණු පිරිනැමීම - ලකුණු 06

| | |
|---|---|
| ප්‍රධාන කරුණු ඉදිරිපත් කර තිබීම, වාක්‍ය අතර සම්බන්ධතාව ප්‍රශස්ත මට්ටමින් පවත්වා ගැනීම, නිරවුල් ව කරුණු ඉදිරිපත් කිරීම, වචන ගණන අදාළ සීමාව තුළ පැවතීම. | ලකුණු 05-06 |
| ප්‍රධාන කරුණු කිහිපයක් පමණක් ඇතුළත් වීම, වාක්‍ය අතර සම්බන්ධතාව තරමක් රැක ගැනීම, වචන ගණන 55-65 අතර පැවතීම, නිරවුල්බව රැකගැනීම. | ලකුණු 03-04 |
| ප්‍රධාන කරුණු ස්වල්පයක්වත් ඉදිරිපත් කර තිබීම, වාක්‍ය අතර සම්බන්ධතාව ගිලිහී තිබීම, වචන ගණන 55ට අඩු වීම, නිරවුල් බව ගිලිහී තිබීම. | ලකුණු 01-02 |

**ප්‍රශ්න අංකය 04**

**අපේක්ෂණය** - ඉදිරිපත් කොට ඇති ඡේදය ඇසුරින් අවබෝධය පිළිබඳ හැකියාව මැනීම

ඉගෙනුම් පල -

- අවබෝධයෙන් යුතු ව පොත පත කියවයි.
- කියවා අවබෝධ කර ගත් කරුණු ඉදිරිපත් කරයි.

**4.** **පහත දැක්වෙන උද්ධෘතය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

මිනිසා පරිපූර්ණත්වයට පත් කිරීම උදෙසා ඉවහල් වන 'කියවීම' යනු සංකීර්ණ ක්‍රියාවලියකි. මුද්‍රිත පෙළක ඇති වචන හඳුනා ගෙන එයින් කියවෙන අරුත අවබෝධ කර ගැනීම 'කියවීම' ලෙස සරල ව හැඳින්විය හැකි ය. වචන හඳුනා ගැනීම සහ අවබෝධය, කියවීමේ දී සිදු වන ක්‍රියාවලි දෙකකි. භාෂාත්මක සංකේත එහි ශබ්ද හා අනුරූප වන ආකාරය අවබෝධ කර ගැනීමේ ක්‍රියාවලිය වචන හඳුනා ගැනීම ලෙස පැහැදිලි කළ හැකි ය. වචනවල හෝ වාක්‍යවල හෝ සබැඳි පෙළක හෝ අර්ථය තේරුම් ගැනීමේ ක්‍රියාවලිය අවබෝධය යි.

ළමයින්ගේ භාෂා කුසලතා සංවර්ධනය වයස අවුරුදු 2-7 කාලයේ දී සිදු වන බව අධ්‍යාපන මනෝවිද්‍යාඥයෝ පවසති. එබැවින් මුල් ළමාවියේ දී මෙන් ම ප්‍රාථමික අධ්‍යාපන අවධිය ආරම්භයේ දී දරුවන් කියවීමට හුරු කිරීම ආරම්භ කළ යුතු ය. එය සම්බර පෞරුෂයකින් යුතු ස්වාධීන කියවන්නකු තැනීමේ අඩිතාලමක් ද වනු ඇත. දරුවන් පොතපතට හුරු කරවීමේ වගකීම දෙමාපියන්ට, ගුරුවරුන්ට මෙන් ම අධ්‍යාපන බලධාරීන්ට ද පැවරී ඇති සුවිශේෂ වගකීමකි.

ප්‍රාථමික පන්තිවල 'කියවීම් කාමර' ආදිය ස්ථාපිත කොට දරුවන් කියවීමේ ක්‍රියාකාරකම් විෂයෙහි යොමු කිරීම සඳහා ගුරුවරුන්ට මග පෙන්විය හැකි ය. ඒ ඒ ශ්‍රේණිවලට යෝග්‍ය වන සේ ළමා සාහිත්‍ය කෘති උපයෝගී කර ගනිමින් ශබ්ද නගා කියවීම, සහකියවීම, මගපෙන්වන ලද කියවීම, ස්වාධීන කියවීම ආදි ක්‍රියාකාරකම් රැසක් ද පාසලේ දී සිදු කළ හැකි ය.

නිසිකලට කියවීමේ කුසලතාව දියුණු කළ විට දරුවන්ට ලැබෙන ප්‍රයෝජන රාශියකි. වාංමාලාව පෝෂණය වීම, ලෝකය පිළිබඳ අවබෝධය පෘථුල වීම, නිර්මාණශීලිත්වය දියුණු වීම, පරිකල්පනය තීව්‍ර වීම, සන්නිවේදන ශක්‍යතා වර්ධනය වීම ඉන් කිහිපයකි.

(i) මෙහි දැක්වෙන පරිදි අවබෝධය යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද?

(ii) කියවීමේ දී සිදු වන ක්‍රියාවලි දෙක මොනවා ද?

(iii) දරුවන් කියවීමට හුරු කිරීම ආරම්භ කළ යුත්තේ කුමන අවධිවල දී ද?

(iv) දරුවන්ට කියවීම ප්‍රගුණ කරවීම සඳහා සිදු කළ හැකි ක්‍රියාකාරකම් දෙකක් නම් කරන්න.

(v) මෙම පාඨයේ සඳහන් වන පරිදි කියවීමේ කුසලතා දියුණු කිරීමෙන් අත් වන ප්‍රයෝජන දෙකක් නම් කරන්න.

(ලකුණු 02 × 5 = 10 යි)

(i). වචනවල හෝ වාක්‍යවල හෝ සබැඳි පෙළක හෝ අර්ථය තේරුම් ගැනීමේ ක්‍රියාවලිය යි.

(ii). වචන හඳුනා ගැනීම
අවබෝධය

(iii). මුල් ළමා වියේ දී
ප්‍රාථමික අධ්‍යාපන අවධිය ආරම්භයේ දී

(iv). ශබ්ද නගා කියවීම
සහකියවීම
මගපෙන්වන ලද කියවීම
ස්වාධීන කියවීම

(v). වාංමාලාව පෝෂණය වීම
ලෝකය පිළිබඳ අවබෝධය පෘථුල වීම
නිර්මාණශීලිත්වය දියුණු වීම
පරිකල්පනය තීව්‍ර වීම
සන්නිවේදන ශක්‍යතා වර්ධනය වීම

**(ii, iii, iv, v ප්‍රශ්න සඳහා එක් කරුණකට ලකුණු 01 බැගිනි.)**



CamScanner

**ප්‍රශ්න අංකය 05**

**අපේක්ෂණය** - ප්‍රායෝගික ලේඛන හැකියාව පිළිබඳ අපේක්ෂකයා සතු කුසලතා මැනීම

ඉගෙනුම් පල -

- ප්‍රායෝගික ලේඛනයේ දී ශිල්පීය උපක්‍රම අනුගමනය කරයි.
- අවශ්‍යතා අනුව විවිධ ප්‍රායෝගික ලේඛන සකස් කරයි.

**5. ඔබ බිම්මල් වගා කරන්නකු යැයි සිතන්න. ඔබේ බිම්මල් ව්‍යාපාරය සහ බිම්මල් ආශ්‍රිත නිෂ්පාදන ජනතාව අතර ප්‍රචලිත කිරීම සඳහා යෝග්‍ය වෙළෙඳ දැන්වීමක් සකස් කරන්න. බිම්මල් ව්‍යාපාරය සඳහා නමක් ද යොදන්න.**

**නැතහොත්**

**ඔබේ පාසලේ පැවැත්වෙන අධ්‍යාපනික ප්‍රදර්ශනය සඳහා ප්‍රධාන අමුත්තා වශයෙන් සහභාගි වන මෙන් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා වෙත යවන ආරාධනා පත්‍රය සකස් කරන්න. කලා සංගමයේ ලේකම් උදිත සමරසිංහ ඔබ යැයි සිතන්න. අධ්‍යාපනික ප්‍රදර්ශනය සඳහා සුදුසු නමක් ද යොදන්න**

(ලකුණු 15 යි)

**වෙළෙඳ දැන්වීම**

**ලකුණු විග්‍රහය**

1. ආකෘතිය - ලකුණු 04යි
2. අන්තර්ගතය - ලකුණු 08යි
3. ශිල්පීය දක්ෂතා - ලකුණු 03යි

**1. ආකෘතිය - ලකුණු 04 යි**

i. ශීර්ෂ පාඨය - ලකුණු 01 යි

ii. පළකරන්නා / ආයතනය - ලකුණු 01 යි

iii. නිර්මාණශීලීත්වය (අකුරුවල ප්‍රමාණය, අකුරුවල හැඩතල, අකුරු වර්ණ ගැන්වීම ආදිය පිළිබඳව ද අවධානය යොමු කරන්න.) - ලකුණු 02 යි

**2 අන්තර්ගතය - ලකුණු 08 යි**

i. ව්‍යාපාරයේ ස්වභාවය - ලකුණු 02 යි

ii. ඒ ආශ්‍රිත නිෂ්පාදන - ලකුණු 02 යි

iii. ව්‍යාපාරය ප්‍රචලිත කිරීමට ගන්නා ක්‍රියාමාර්ග - ලකුණු 02 යි.

(උදා : නිවෙස්වලට බෙදා හැරීම, වට්ටම් පිරිනැමීම ආදි වශයෙන් සුදුසු කරුණු 2ක් තිබිය යුතු ය.)

iv බිම්මල් පරිභෝජනයෙන් ලැබෙන වාසි - ලකුණු 02 යි

03. **ශිල්පීය දක්ෂතා - ලකුණු 03 යි.**

නිවැරදි අක්ෂර වින්‍යාසය, උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය, පැහැදිලි අත්අකුරු, නිවැරදි පද බෙදීම, විරාම ලක්ෂණ සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.

* ප්‍රමාණවත් කරුණු හෝ අදාළ කරුණු අන්තර්ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි ආනුපාතික ලකුණක් පිරිනමන්න.
* නියමිත ආකෘතිය අනුගමනය කර නොමැති කල්හි අන්තර්ගතය සඳහා දිය හැකි උපරිම ලකුණු ගණන 03යි.



CamScanner

**නැතහොත්,**

**ආරාධනා පත්‍රය**

**ලකුණු විග්‍රහය - මුළු ලකුණු 15 යි.**

1. ආකෘතිය - ලකුණු 04 යි.
2. අන්තර්ගතය - ලකුණු 08 යි.
3. ශිල්පීය දක්ෂතා - ලකුණු 03 යි.

**1. ආකෘතිය - ලකුණු 04 යි.**

i. ආරාධනය කරන්නා - ලකුණු 01 යි.
ii. ආරාධනා කරන දිනය - ලකුණු 01 යි.
iii. නිර්මාණශීලිත්වය - ලකුණු 02 යි.

**2 අන්තර්ගතය - ලකුණු 08 යි.**

i. ප්‍රදර්ශනයේ ස්වභාවය - ලකුණු 01 යි.
ii. ප්‍රදර්ශනයේ නම - ලකුණු 02 යි.
iii. ප්‍රධාන ආරාධිතයා - ලකුණු 01 යි.
iv. පැවැත්වෙන දිනය - ලකුණු 01 යි.
v. පැවැත්වෙන වේලාව - ලකුණු 01 යි.
vi. පැවැත්වෙන ස්ථානය - ලකුණු 01 යි.
vii. ආරාධනා කිරීම - ලකුණු 01 යි.

**3. ශිල්පීය දක්ෂතා - ලකුණු 03 යි.**

- නිවැරදි අක්ෂර වින්‍යාසය, උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය, පැහැදිලි අත්අකුරු, නිවැරදි පද බෙදීම, විරාම ලක්ෂණ, ඡේද වෙන් කිරීම සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.
- ප්‍රමාණවත් කරුණු හෝ අදාළ කරුණු අන්තර්ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි ආනුපාතික ලකුණක් දෙන්න.
- නියමිත ආකෘතිය අනුගමනය කර නොමැති කල්හි අන්තර්ගතය සඳහා දිය හැකි උපරිමය ලකුණු ගණන 03 කි.



CamScanner

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය
## III පත්‍රය

- ❖ උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් උත්තර සපයන්න.
- ❖ 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.

**මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.**

මෙ පත්‍රයේ දී නිර්දිෂ්ට සාහිත්‍ය පාඨ පිළිබඳ ව අපේක්ෂකයාගේ අවබෝධය හා රසවින්දන හැකියාව ඇගයීමට භාජනය කෙරේ.

**ප්‍රශ්න අංකය 01**

**අපේක්ෂණය** - නිර්දිෂ්ට ග්‍රන්ථ පරිශීලනය පිළිබඳ පරිචය ඇගයීම

ඉගෙනුම් පල -

- නිර්දිෂ්ට කෘති ලියැවුණු කාලය හා කතුවරයා හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- නිර්දිෂ්ට කෘති නිර්මාණය කළ කතුවරුන්ගේ වෙනත් කෘති නම් කරයි.
- නිර්දිෂ්ට කෘතිවල කතුවරුන්ගෙන් සාහිත්‍යයට සිදු වූ සේවාව අගය කරයි.

**ලකුණු විග්‍රහය** - මුළු ලකුණු 20 යි.
මෙම ප්‍රශ්නයට කෙටි උත්තර අපේක්ෂිත අනුප්‍රශ්න දහයක් ඇතුළත් වේ. එක් අනුප්‍රශ්නයක එක කොටසකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 20කි.

**1. (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

**(i) "කිම, මහරජ, තට බිම්සර මහරජ කුපිත වියැ හො? විසාලා මහනුවර වැසි ලිච්ඡවි රජහු කුපිත වූහ හො? සෙසු ප්‍රතිපක්ෂ රජ කෙනෙක් කුපිත වූහ. හො?"**

**(අ) මේ ප්‍රකාශය කරනු ලැබූයේ කවුරුන් විසින් ද?**

**(ආ) මේ ප්‍රකාශය හා සබැඳි අවස්ථාව කුමක් ද?**

(අ) බුදුරජාණන් වහන්සේ

(ආ) කොසොල් රජතුමා අංගුලිමාල අල්ලා ගැනීමට යාමට පෙර, බුදුන් වහන්සේ එම ගමන වළක්වනු ඇතැයි අපේක්ෂාවෙන් සේනාව සමග ජේතවනාරාමයට ගොස් බුදුන් වහන්සේ හමුවට ගිය අවස්ථාවේ.

**(ii) නො දැන ම තමා බල**
**සබයට අවුත් නො පැකිළ**
**වැද රද පද කමල**
**දෙසෙක මුසිලයා ද උන් කල**

**(අ) තද කළු අකුරින් මුද්‍රිත පද්‍ය පාදයේ අන්තර්ගත කාව්‍යාලංකාරය කුමක් ද?**

**(ආ) මේ පද්‍යය උපුටා ගත් කෘතිය අයත් වන්නේ කවර අවධියකට ද?**

(අ) අනුප්‍රාස / අනුප්‍රාසාලංකාරය/ රූපක/ රූපකාලංකාරය

(ආ) කෝට්ටේ සාහිත්‍ය අවධියට



CamScanner

(iii) පහත දැක්වෙන කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

හිරිමල් සිනා රැළි පෙණ පිඬු මිහිරි තම
ගල් පරවල ම හැපි හැපි බිඳි කරමි මම

(අ) ..................................................
(ආ) ..................................................

(අ) සම තැනි තලාවල හමු වෙයි අලස කම
(ආ) නිරසයි අතරමඟ අවහිර නුදුටු බිම ( නිරසයි )?

(iv) "කුරක්කන් අඹරන්ඩ අය නැතුවට කන්ඩ අය නම් ඕනෑ තරම් ඉන්නව. මටත් කරන්ඩ තිබුණෙ අර වී ඇටය අහුලපු කිකිළි කරපු දේ"
(අ) මේ ප්‍රකාශය ඇතුළත් නිර්මාණයේ කතුවරයා කවරෙක් ද?
(ආ) එම කතුවරයාගේ මුල් ම කෙටිකතා සංග්‍රහයේ නම කුමක් ද?

(අ) කේ. ජයතිලක මහතා
(ආ) පුනරුත්පත්තිය සහ තවත් කෙටිකතා

(v) "ඇයට තමා හා එකට ඉගෙන ගත් මිතුරියක් සිටියා ය. මිතුරිය බැලීමට ගොස් පෙරළා ආ සැම විටෙක ම ඇ බලවත් චිත්ත සන්තාපයට හා දුක් වේදනාවකට භාජන වූවා ය."
(අ) මේ ප්‍රකාශය උපුටා ගෙන ඇති නිර්මාණයේ නම ලියන්න.
(ආ) මෙහි සඳහන් තැනැත්තිය චිත්ත සන්තාපයට පත්වීමට හේතුව කුමක් ද?

(අ) දියමන්ති මාලය
(ආ) සිය මිතුරිය සතු වූ එහෙත් තමාට නොමැති සැප සම්පත් පිළිබඳ දුක සිතීම

(vi) (අ) 'අමාවතුර' කෘතිය රචනා කොට ඇත්තේ බුදුරජාණන් වහන්සේගේ කුමන ගුණයක් පාදක කර ගෙන ද?
(ආ) මේ කෘතිය රචනා වූ කාලය ලෙස පිළිගැනෙන්නේ කුමන අවධිය ද?

(අ) පුරිස දම්ම සාරථි ගුණය
(ආ) පොලොන්නරු අවධිය

(vii) කුළින් කුළම සිහිල'ඹ වැහෙන කඳුරුය
දොළින් දොළම කල් යල් කරන කුඹුරුය
පළින් පළම තල් පොල් ගෙ වතු මැඳුරුය
තළින් තළම පුල් පියුමු'පුල පඬුරුය
(අ) ඉහත සඳහන් කවිය ඇතුළත් කාව්‍ය ග්‍රන්ථයේ නම කුමක් ද?
(ආ) සීතල ජලය යන්න සඳහා ඉහත කවියේ යෙදී ඇති වචනය කුමක් ද?

(අ) හංස සන්දේශය
(ආ) සිහිල'ඹ

(viii) සැඟවෙමි - එබෙමි - නිසසල වෙමි - සසල වෙමි
ඇඹරෙමි - එහෙත් පසු නොබසිමි - නොනවතිමි
(අ) මේ පද්‍ය ඛණ්ඩය ඇතුළත් කාව්‍ය නිර්මාණයේ නම ලියන්න.
(ආ) පද්‍ය පාද දෙකෙන් මතු කෙරෙන ශබ්දාලංකාරය කුමක් ද?

(අ) ගංගාවේ සංගීතය
(ආ) අනුප්‍රාසය/අනුප්‍රාසාලංකාරය/එළිසමය



CamScanner

(ix) "මේ ගම දැන් හොල්මන් අඩිකෝඩ පිරුණු යකුන් අරක්ගත් කාලකණ්ණි ගමකි. ළමයින් හා මහල්ලන් ද නැසී යන්නාක් මෙන් ගමත් දැන් නැසී යයි."

(අ) මේ ප්‍රකාශය කරනු ලැබූයේ කවුරුන් විසින් ද?

(ආ) මේ පාඨය උපුටා ගත් කෘතියේ නම කුමක් ද?

(අ) නැංචොහාමි/ ආරච්චි මාධියා/ ආරච්චි හාමිනේ

(ආ) බැද්දේගම

(x) එල්ල වෙන්ට කවි කර කීවෙමි බොහොම
කොල්ල කන්ට එහි සිටුපාටෝ බොහොම
ගොල්ල සමග එහි ඌරෝ සැමදාම
හිල්ල අඟහි සත් දවසින් බැලුවාම

(අ) මේ පද්‍යය ඇතුළත් පාඨමේ නම ලියන්න.

(ආ) මේ පද්‍යය අයත් වන්නේ කුමන කාව්‍ය වර්ගයකට ද?

(ලකුණු 02 × 10 = 20 යි)

(අ) කුරහන් ඉසිමුව කළුවර බලාලා

(ආ) ජන කවි/ කුරක්කන් කවි

ප්‍රශ්න අංකය 02

අපේක්ෂණය - 1. නිර්දිෂ්ට සාහිත්‍ය පාඨ පිළිබඳ විමර්ශනාත්මක අවබෝධය

ඉගෙනුම් පල -

- ගුත්තිල කාව්‍යයේ නිර්දිෂ්ට කවි අවබෝධයෙන් යුතු ව කියවා අර්ථය ඉදිරිපත් කරයි.
- 'අඟුල්මල් දමනය' කතාව අවබෝධයෙන් යුතු ව කියවා අර්ථය ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ට සන්දේශ කවිවල අර්ථය ලිහිල් බසින් ඉදිරිපත් කරයි.
- උම්මග්ග ජාතකයේ නිර්දිෂ්ට කොටස්වල අර්ථ ලිහිල් බසින් ලියයි.

ලකුණු විග්‍රහය - මුළු ලකුණු 20 යි. (එක් කොටසකට ලකුණු 04 බැගිනි.)

(අ) කොටස ලකුණු 02 යි.

(ආ) කොටස ලකුණු 02 යි.

2. පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) පටන් සුරිඳු දුන් උපදෙස් සිහි කොට
ඉටන් බෙලෙන් දැමුවෙන් ගුළි අහසට
තුටන් වඩන සුර අඟනෝ බැස සිට
පටන් ගත්තු නව සියයක් නැටුමට

(අ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙන ම ලියන්න.

(ආ) මුළු පද්‍යයේ ම අදහස සරල බසින් ලියන්න.

(අ) පටන් - පළමු කොට/ ආරම්භයේ ම/ ප්‍රථමයෙන්

ඉටන් - අධිෂ්ඨාන/ අදිටන්

(ආ) පළමු කොට සක් දෙව් රජතුමා දුන් උපදේශය සිහි කොට අධිෂ්ඨාන බලයෙන් ගුළි අහසට දැමූ හෙයින්, සතුට වඩන සුර අඟනෝ නව සියයක් බැස සිට නැටුමට පටන් ගත්හ./ගත්තෝ ය.

**(ii)** **"දර පලා සඳහා වල් යන්නාහු නැති. ඒ ගමට වැදැ පයින් පැහැරැ දොර ගලවා-පියා එහි හොතුවන් මරා-පියා 'එකෙකැ දෙකෙකැ' යි ගැණැගෙන-යෙයි. එ කල්හි ගම්වැස්සො ගම් පියා ගොස් නියම්ගම් වන්හ. නියම්ගම්වැස්සො ගොස් නුවර වන්හු. තුන් යොජනක් තන්හි මිනිස්හු ගෙ පියා දරුවන් අතැ ගෙනැ ගොස් සැවැත් නුවර වටා කඳවුරු බැඳැ රාජාඞ්ගණයෙහි රැස් වැ ''මහරජ, තා ගෙ රට අඞ්ගුලිමාල නම් සොරෙක් වි යැ'' කිය කියා වලපිත්.''**

**(අ)** **තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.**

**(ආ)** **අඟුල්මල් නිසා බියට පත් ජනතාව හැසුරුණු ආකාරය කෙටියෙන් දක්වන්න.**

(අ) වල් යන්නා හු - කැලයට යන්නා වූ අය/ කැලයට යන පුද්ගලයෝ/ වලට යන අය
රාජාඞ්ගණයෙහි - රජමාලිගා මිදුලෙහි/ රජ මිදුලෙහි/ රජ ගෙදර මිදුලෙහි

(ආ) බියට පත් ගම්වැසියන්, ගම් අත්හැර නියම්ගම්වලට ගිය අතර, නියම්ගම්වල වාසයකරන්නෝ නුවරට ගියහ. යොදුන් තුනක පමණ ප්‍රදේශයක මිනිස්සු ගෙවල් අත හැර ගොස් දරුවන් සමග සැවැත්නුවර වටා කඳවුරු බැඳගෙන රජමාලිගයෙහි මිදුලට රැස්වී "මහරජ තුමනි, ඔබගේ රාජ්‍යයෙහි අංගුලිමාල නමින් සොරකු ඉන්නවා යැයි කිය කියා වැලපෙති./ වැලපෙත් "

**(iii)**
**දිමුත් වෙහෙර** වට විසිතුරු මල් වතු ය
එහිත් සුවඳ මල් නිති වෙයි මිණි මුතු ය
**මහත් තුරු** මියුරු පල ගෙන නැමී අතු ය
රැගත් සෙවණ නො හැරම සිටි පොල් වතු ය

**(අ)** **තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.**

**(ආ)** **කවියා, විහාරය ආශ්‍රිත පරිසරයේ විචිත්‍රත්වය වර්ණනා කර ඇති අයුරු කෙටියෙන් ලියන්න.**

(අ) දිමුත් වෙහෙර - දීප්තිමත් විහාරය/ බබළන විහාරය
මහත් තුරු - විශාල ගස්/ මහා වෘක්ෂ

(ආ) විහාරය අවට විචිත්‍ර වූ මල්වතු සහිත ය. නිරන්තරයෙන් එහි සුවඳ මල් පිපේ. විශාල ගස්වල රසවත් එල සැදී අතු නැමී ඇත. එමෙන් ම නිතර ම සෙවණ දෙන්නා වූ පොල්වතු සහිත ය.

**(iv)**
**නිමල් සඳ පහන් වැනි වැලි පිට** උදුළ
**සුපුල් මල් යහන් ලිය මඬු ලිය** ගෙ පෙළ
**එකල් කෙළන වන දෙව් ලිය දැක** කොමළ
**ළසල් රුකෙක සැතපෙව ළපලු** සිහල'ළ

**(අ)** **මේ පද්‍යයේ අන්තර්ගත උපමාව සහ උපමේය වෙන් කොට දක්වන්න.**

**(ආ)** **කවියා සැළලිහිණියාට විවේක ගන්නට යැයි පවසන්නේ කුමන දේවල් නැරඹීමෙන් අනතුරු ව ද?**

(අ) උපමාව - නිමල් සඳ පහන් වැනි/ පිරිසිදු සඳ එළිය වැනි / නිර්මල සඳ පහන් වැනි
උපමේය - වැලි තලාව/ බබළන වැලි තලාව / සුදු වැල්ල / වැලි පිට උදුළ

(ආ) වැලිතලාවේ මැනවින් පිපුණු මල් යහන් ද ලතා මණ්ඩප ද ඉහළින් වැල් එතී ගෙවල් මෙන් සැදුණ ආවරණ ස්ථානවල ද ඒ වෙලාවෙහි ක්‍රීඩා කරන්නා වූ කොමළ වන දෙවඟනන් බැලීමෙන් අනතුරු ව

**(කරුණු දෙකක් ඇත්නම් ලකුණු 01කි. කරුණු 03ක් හෝ 04ක් නම් ලකුණු 02කි.)**



CamScanner

(v) "ඒ ගිරා පණ්ඩිතයන්ගේ මෙ බඳු වතෙක් ඇත්තේ ය. ඉදින් කිසි කෙනෙකින් ගෙනා හස්නක් පණ්ඩිතයන් වහන්සේට පමණක් කිය යුතු වී නම් උන් වහන්සේගේ දසරුවට බස්නාහ; ඉදින් අමරා දේවීනුත් ඇසුව මනා වී නම් ඇකයෙහි ගොස් හිඳිනාහ; ඉදින් බොහෝ දෙනා ඇසුව මනා වී නම් බිමට බස්නාහ. එදවස් ගිරා පණ්ඩිතයෝ පණ්ඩිතයන් වහන්සේගේ දසරුවෙහි බැස උන්හ. ඒ සලකුණෙන්, 'රහසැ බිණිය යුතු යැ' යි අමරා දේවීන් හා බොහෝ දෙන ඉවත් ව ගියහ."

**(අ)** තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

**(ආ)** හස්නක් ප්‍රකාශ කිරීමේ දී ගිරා පණ්ඩිතයන් අනුගමනය කළ ක්‍රියා පිළිවෙත කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 04 × 5 = 20 යි)

(අ) දසරුවට - උරහිසට/ උරයට

ඇකයෙහි - උකුළෙහි

(ආ) ගිරා පෝතකයා පණ්ඩිතයන් වහන්සේට පමණක් කිය යුතු හස්නක්/පණිවුඩයක් නම් උන්වහන්සේගේ උරහිසට/ දසරුවට බසී. අමරා දේවියත් ඇසිය යුතු වූ හස්නක් නම් උන්වහන්සේගේ උකුළෙහි/ ඇකයෙහි හිඳියි. බොහෝ පිරිසක් ඇසිය යුතු හස්නක් නම් බිමට බසී.

3 ප්‍රශ්නය

**ඉගෙනුම් පල**

- අවස්ථා සිද්ධි හා චරිත නිරූපණය පිළිබඳ ව සැලකිලිමත් වෙමින් උම්මග්ග ජාතකයෙහි නිර්දිෂ්ට කොටස රස විඳිමින් විචාරය කරයි.
- ගුත්තිල කාව්‍යයෙහි නිර්දිෂ්ට කොටස රස විඳිමින් විචාරය කරයි.

**3.** **මහෞෂධ පඬිතුමා සතු ව තිබූ,**

- **ස්ථානෝචිත ප්‍රඥාවත්**
- **කාර්ය සංවිධානයත්**

**යුද්ධ ජයග්‍රහණය සඳහා යොදා ගත් ආකාරය උම්මග්ග ජාතකයේ විස්තර කෙරෙනුයේ පාඨක සිත් ඇද බැඳ ගන්නා ආකාරයෙනි.**

**නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.**

මහෞෂධ පඬිතුමා සතු ව තිබූ ස්ථානෝචිත ප්‍රඥාවත්, කාර්ය සංවිධානයත් යුද්ධ ජයග්‍රහණය සඳහා යොදා ගත් ආකාරය පාඨක සිත් ඇද බැඳ ගන්නා ආකාරයෙන් උම්මග්ග ජාතකයෙහි විස්තර කර ඇත.

❖ **ස්ථානෝචිත ප්‍රඥාව**

- සුරා පාන උත්සවයේ දී එක්සියයක් රජදරුවන් මරණයට පත්වීම වැළැක්වීම සඳහා උපාය යෙදීම.

උදා : "තෙපි ඔබ ගොස් රජ්ජුරුවන්ට අසුන් පනවා ලූ කල..."

- චූලනි බ්‍රහ්මදත්ත රජුගේ සේනාව මියුලු නුවර වටලා ගත් අවස්ථාවේ සතුරා නොමග යවමින් කුපිත කිරීම සඳහා නුවර වැසියන්ට ප්‍රීති උත්සව පැවැත්වීමට උපදෙස් දීම

උදා : "පින්වත්නි, තෙපි හැම 'සතුරෝ' වටලා ගත්තෝ වේදැ'යි නොසිතා, මල් ගඳ විලෙවුන්..."

- සතුරා විසින් මියුලු නුවරට පිටතින් ජල සැපයුම අවහිර කළ අවස්ථාවේ ඇතුළු නුවර පැන් හිඟයක් නොමැති බව පෙන්වීම සඳහා සැට රියන් දිග දණ්ඩක් සහිත ඕලු මලක් වැවෙන්නට සලස්වා එය සතුරා වෙත යැවීම

උදා : "සැට රියන් දිග උණ දණ්ඩක් ගෙන්වා සරියේ දෙකක් කොට පළා..."

- මිථිලා නුවරට වී සාල් පිටතින් සැපයුම අවහිර කළ අවස්ථාවේ ඇතුළු නුවර වී සාල් හිඟයක් නොමැති බව පෙන්වීම සඳහා අනුප්‍රාකාර මත්තෙහි වී වැපිරවීම

උදා : "අනුප්‍රාකාර යැයි කියන ලද පදනම් මුඳුනේ කලල් අතුරුවා..."

- දර අවහිර කරන ලද අවස්ථාවේ දර හිඟයක් නොමැති බව පෙන්වීම සඳහා අනුප්‍රාකාර මත දර රැස් කරවීම

උදා : " ඒ මන්ත්‍රණයත් පෙර පරිද්දෙන් ම දැන වදාරා පවුරු පිටින් වී හා ගොයම් හා හරවා පිටතට පෙනෙන නියායෙන් දර රැස් කරවා පී සේක."

- ධර්ම යුද්ධයේ දී කේවට්ට බමුණාගෙන් වැඳුම් ලබන බව පෙන්වීම සඳහා අෂ්ටවංක මාණික්‍ය බිම වැටෙන්නට සැලැස්වීම

උදා : "හෙ ද ගනුව'යි අත දික් කොට, අත ඇඟිලි අග මැණික එළා ලූ සේක."

❖ **කාර්ය සංවිධානය**

මියුලු නුවරට පැමිණිය හැකි සතුරු ආක්‍රමණ ගැන දැන ගැනීම සඳහා දඹදිව සියලු රාජ්‍ය වෙත චරපුරුෂයන් පිටත් කර යැවීම හා ගිරා පෝතකයන් චරපුරුෂ සේවයේ යෙදවීම

- චූලනී බ්‍රහ්මදත්ත රජු සහ කේවට්ට බමුණා අතර පැවැත්වුණු සතර කන් මන්ත්‍රණය පිළිබඳ පුවත අසා ඇතුළු නුවර හුන් දිළින්දන් පිටතට යවා පිටත හුන් ධනවතුන් ඇතුළු නුවරට ගෙන්වා ගැනීම මගින් සතුරු ආක්‍රමණයට සූදානම් වීම

උදා : " ඇතුළු නුවර හුන් දිළිඳුන් පිටත් කරවා පිටිනුවර ලැවූ සේක."

- චූලනී රජුගේ සේනාව මියුලු නුවර වටලා ගත් අවස්ථාවේ රාජ්‍යයේ ආරක්ෂක විධි විධාන තර කිරීම

උදා : "ඒ අසා මහ බෝසතාණන් වහන්සේ වඩාලා ම කළ මනා විධානයෙහි නොපමා වූ සේක."

- චූලනී රජුගේ සේනාව මියුලු නුවරට ඇතුළු වීම වැළැක්වීම සඳහා මහෞෂධ පඬිතුමන්ගේ යෝධයන් විසින් මඩ හා වැලි ආදිය යොදනු ලැබීම සහ උසුළු විසුළු කරමින් සතුරා අධෛර්යයට පත් කිරීම

උදා : " බෝධිසත්වයන් වහන්සේගේ යෝධයන් විසින් දමන ලද කලල් වැලි ආදියෙන් මහා විනාශයට පැමිණ....... "

සතුරා විසින් යොදන ලද විවිධ යුද්ධ උපායන්ට සුදුසු ප්‍රතිඋපා යෙදීම.

ආදී සුදුසු උදාහරණ දක්වමින් පිළිතුරු ලියා තිබීම ප්‍රමාණවත් ය.

(ලකුණු 15)



CamScanner

**නැතහොත්**

**වීණා වාදනයේ මිහිරි බව කියා පෑමට,**

- **සුරඟන රැඟුමත්**
- **අවට රැස්වූවන්ගේ ස්වභාවයත්**

**උචිත සේ ගැළපීමට ගුත්තිල කතු හිමියන් දැක්වූ කුසලතාව නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් ඉදිරිපත් කරමින් පැහැදිලි කරන්න.**

**(ලකුණු 15 යි)**

ගුත්තිල සහ මූසිල අතර වීණා වාදන තරගය පැවැත්වූ අවස්ථාවේ ගුත්තිල ඇදුරුතුමාගේ වීණා වාදනයෙහි මිහිරි බව විදහා දැක්වීමට

- සුරඟන රැඟුමත්
- අවට රැස්වූවන්ගේ ස්වභාවයත්

උචිත සේ ගැළපීමට ගුත්තිල කතු හිමියෝ සමත් වෙති.

### ❖ සුරඟන රැඟුම

- සක් දෙවිඳුගේ උපදේශය පරිදි අධිෂ්ඨාන බලයෙන් ගුළි අහසට දැමූ විට නවසීයයක් සුරඟනන් නැටුමට පටන් ගත් ආකාරය

උදා : "පටන් සුරිඳු දුන් උපදෙස් සිහිකොට "

- සුරඟනන් වීණා වාදනයට අනුව නර්තනයේ යෙදෙන ආකාරය

උදා : "ළඟ ළඟවා උනුනට කර වාදය<br>නොවරදවා වීණා පද වාදය "

- විදුලිය ලක්ෂ ගණනක් එක විට දිස් වූවාක් මෙන් දිව්‍යාංගනාවන් යටැසින් බලමින් නැටුමෙ යෙදීම

උදා : " යටැසින් ලන බැල්මෙන් සුර විලසී<br>දිසි මෙන් විය විදුලිය සිය දහසී"

- අනංගයාගේ දීප්තිමත් කීර්තිය වැනි සුවඳ මල් හිස් මුදුනෙහි පැලඳ, නටන දිව්‍යාංගනාවන්ගේ රංග විලාසය

" දිමුතු යසස් වන් කුසුම සරාගේ "

- රූප රාශියක් අඳිනා ලෙස විදුලිය ප්‍රභා ඇති අත් ලෙළවමින් සුරඟනන් රඟන ආකාරය

උදා : "රූ රැසේ අඳිනා ලෙසේ අත් ලෙළ දිදී විදුලිය පබා "

### ❖ අවට රැස්වූවන්ගේ ස්වභාවය

- වීණා වාදනය පටන් ගත් කෙණෙහි ම මිනිසුන්ගේ ඝෝෂාව නතරවීම

උද : " නවතා ගිගිරියේ<br>අසන ලෙස සිත් පිරියේ "

- වීණා නාදයට බැඳුණු සිත් ඇති රජුගේ රැකවලුන්ගේ අත්වලින් නොදැනීම ආයුධ ගිලිහී වැටීම

"නිති නිරිඳුගෙ රැකවලෙහි නියුත්තෝ<br>රුති ලෙස රුපු'නොද බිඳ ජය ගත්තෝ "

- වීණා නාදයෙන් මත් මත් වූ පුරාංගනාවන්ගේ ඇකයේ සිටි දරුවන් නොදැනීම ගිලිහී වැටුණු බව

උද : "මන මත් කරවන දන මුළු දෙරණා<br>නොදනිත් දරුවන් ඇකයෙන් වැටුණා"



CamScanner

- වීණා නාදයට වශීකෘත වූ විවිධ සතුන් ඉතා ආශාවෙන් වීණා නාදය අසා සිටි ආකාරය

  - ඇතුන්
    "පිය සත් නොව බිඟු දැල් රැඳි කොපුලී"
  - අශ්වයන්
    "කන් කලු වෙණ නද ඇසු මෙහි ලොබිනෝ"
  - මත්ස්‍යයන්
    "පත්සිළු වීණා නද පසු බැස්වූ"
  - සියොතුන්
    "වර වෙණ නද අසමින් සිත සතොසිනි"
  - රිළවුන්
    "යොදා සවන් වෙණ නද රස සුලබව"
  - කොවුලන්
    "එමා සත්හු වෙණ නද අසමානය"
  - ගුරුළන් - නයින්
    "අසන රිසින් නයි කැල මසළෝයා"
  - මොනරුන්
    "සතොස් කරන වීණා නද ඇසුමට"
  - ගිරවුන්
    "වෙසෙසින් යන නද දිගත පුරායා "
  - මුවන්
    "රැති වනපෙතිනැවිදින් සුමුවෝයා"

**එක් කරුණකට සුදුසු උදාහරණ 02ක බැගින් දක්වා තිබීම ප්‍රමාණවත් ය.**

**04 ප්‍රශ්නය**
**ඉගෙනුම් පල**

- 'දැතේ කරගැට සිඹ සනසන්නට' පද්‍ය නිර්මාණය රස විඳිමින් විචාරය කරයි.
- 'අපට වැසිකිළියක්' කෙටිකතාව රස විඳිමින් විචාරය කරයි.

**4.**
- **අතීත ශ්‍රී විභූතියත්**
- **අනාගත සමෘද්ධියත්**

**අපූර්ව ලෙස සංකලනය කිරීමට කවියා සමත් වී තිබීම 'දැතේ කරගැට සිඹ සනසන්නට' කාව්‍ය නිර්මාණයේ සාර්ථකත්වයට හේතු වී ඇත.**

**එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විස්තර කරන්න.**

'දැතේ කරගැට සිඹ සනසන්නට' කාව්‍ය නිර්මාණයේ දී
අතීත ශ්‍රී විභූතියත්
අනාගත සමෘද්ධියත්
අපූර්ව ලෙස සංකලනය කිරීමට කවියා සමත් වී තිබීම



CamScanner

**අතීත ශ්‍රී විභූතිය**

- අතීතයේ යෝධයන් වැනි මිනිස් සමූහයා දැඩි සේ වෙහෙස මහන්සි වී වැඩ කළ බව
- විශාල වැව් අමුණු ඉදි වූ ආකාරය
- ඒ මගින් සමෘද්ධිමත් හා ස්වයංපෝෂිත ආර්ථිකයක් ගොඩනැගී තිබූ ආකාරය
- වසර දෙදහස් පන්සීයයක අතීතයේ සිට ඔවුන් ස්වයංපෝෂිත දේශයක් බිහි කිරීමට වෙහෙස වූ අයුරු පද්‍ය කාව්‍ය මගින් උදාහරණ දක්වමින් විස්තර කර තිබිය යුතු ය.

උදා :

"දහසක් වැව් බැඳි යෝධ මිනිස් කැල
යළි ඉපදී ඇති මවු දෙරණේ
සත් රුවනින් නව නිදහන් මතු වී
පුතුගෙ සිනාවෙනි ඔප වැටුණේ

දෙදහස් පන්සිය වසරක් තිස්සේ
මා දුටු සිහිනය පුංචි පුතුන්
ඔබ හට ලෝකය ඉදි කර දී මිස
යා නොහැකි ය මට පුංචි පුතුන්"

❖ **අනාගත සමෘද්ධිය**

- අතීත ශ්‍රී විභූතිය වර්තමානය කරා රැගෙන එන්නේ නැවතත් වෙහෙස වී වැඩ කිරීම මගින් බව
- හෙට නව ලොව ඉදි වන්නේ, දරුවන් වෙනුවෙන් ගත වෙහෙසා වැඩ කිරීමෙන් බව
- දරුවන්ගේ ජීවිතය සැපවත් කරමින් නිවහල් දේශයක් අනාගතය වෙනුවෙන් ඉදි වන ආකාරය දක්වා ඇති බව

උදා : "අඩ සඳ මෝරන මැදියම් අහසින්
බිලිඳු හදට කිරි දියර ගලයි
හෙට ඉදි වන නව ලෝකය දැක දැක
පුංචි පුතා හීනෙන් හිනැහෙයි

දෑසේ කඳුළැලි පිසදා බලනෙමි
හෙට හිරු එළියට වඩින දිනේ
ණය නැති බිය නැති නිවහල් යුගයක
පුංචි පුතා රජ කරනු පෙනේ"

**එක් කොටසකට මෙවැනි යෝග්‍ය උදාහරණ දෙක බැගින් දක්වමින් පිළිතුරු ලියා තිබීම ප්‍රමාණවත් ය.**



CamScanner

**නැතහොත්**

- **උචිත අවස්ථා යොදා ගැනීමත්**
- **සිද්ධි ගැළපීමත්**

**'අපට වැසිකිළියක්' කෙටිකතාව පාඨක සිත් ගැනීමට හේතු වී ඇත.**
**එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විස්තර කරන්න.** **(ලකුණු 15 යි)**

අපට වැසිකිළියක් කෙටිකතාව පාඨක සිත් ගැනීමට හේතු වී ඇත්තේ,

- උචිත අවස්ථා යොදා ගැනීමත්
- සිද්ධි ගැළපීමත් නිසා ය.
  පහත උදාහරණ ඒ සම්බන්ධයෙන් යොදා ගත හැකි ය.

❖ **උචිත අවස්ථා යොදා ගැනීම**

- කතාවේ එන විවිධ චරිතවල ක්‍රියාකාරකම් මගින් උචිත අවස්ථා සිත් ගන්නා අයුරින් ඉදිරිපත් කර ඇති අයුරු දක්වා තිබිය යුතු ය.

**කුරහන් පිටි ඇඹරීමට උදවු වන ලෙස අක්කා ඉල්ලීම් කරන අවස්ථාව**

උදා: "හෙට උදේට කුරහන් රොටි ටිකක් හදන්න කුරහන් ටික අඹරගන්න උදව් වෙනව ද මල්ලියෙ"
" තෝ හොර අලිය වගෙ මෙතන කකා ඉන්නව"
"ඔව් ! හැමදේම බැහ්! බැහ්! කට විතරයි හොල්ලන්න පුළුවන්."
" පිච්චෙයි, පිච්චෙයි කලබල නැතිව ඉඳින් ටිකක් "

- මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාගේ පැමිණීම (අමුත්තා පැමිණි අවස්ථාව)

උදා: "අය්යෙ, අය්යෙ පොලිස්කාරයෙක්!"
"කවුද මේ ගෙදර ගෘහමූලිකයා"
"කෝ වැසිකිළිය හැදුවද?"
"ඔව ගිහින් කියනවා මට නෙමෙයි, උසාවියට."

❖ **සිද්ධි ගැළපීම**

- මහජන සෞඛ්‍ය පරීක්ෂක ගැමියන්ට වැසිකිළි සෑදීම සඳහා උපදෙස් දීම.
  උදා: " සුමාන දෙකක් ඇතුළත වැසිකිළියක් හදන්න ඕනෑ "

- ගමේ අනෙක් නිවෙස්වලට මහජන සෞඛ්‍ය පරීක්ෂක යාමට සූදානම් වීම.
  උදා : "මෙතනින් එහාට ගෙවල් තියෙනවද?"
  "දැන් හවස් උණා වැඩියි එහෙට වෙන දවසක යනව"
- වැසිකිළිය තැනීම පිළිබඳ ගමේ අනෙක් අය අතර කතාබහක් සිදු වීම
  " මෙච්චර කල් නොතිබුණු කක්කුසියක් මොකද එකපාරටම ඕනෑ වුණේ ?"
  " උඹ ඔහොම කියනව කොළඹ රටේ කක්කුස්සි තියෙන්නෙ කොහොමද දන්නවද? මේ වගේ එපිටින් නෙමෙයි "
- වැසිකිළිය සෑදීමෙන් පසු පාවිච්චි නොකිරීම නිසා ඇති වන සිද්ධි
  "ඇහැටවත් නොපෙනෙන සතුන්ට පුළුවන් ද? මෙච්චර ලොකු මිනිස් ඇඟකට හානි කරන්න?"
  " පෙරේතයො කෑම කන්නෙ නෑ "
  " අම්මේ ... යැයි කට පුරවගෙන ඔහු කුස්සියෙ දෙසට දුවන්නට සූදානම් විය."
  " හේ! එයාට විතරක් මොක ද? මමත් හෙට යනවා."

**මෙවැනි යෝග්‍ය උදාහරණ දක්වමින් පිළිතුරු ලියා තිබීම සෑහේ.**



CamScanner

ප්‍රශ්න අංකය 05,06,07

ඉගෙනුම් පල

- 'සිංහබාහු' නාට්‍යයේ නිර්දිෂ්ට නාට්‍ය පෙළ රස විඳිමින් විචාරය කරයි.
- අවස්ථා සිද්ධි හා චරිත නිරූපණය පිළිබඳ ව සැලකිලිමත් වෙමින් 'උග්ගසේන නම් සිටුපුත්තුගේ වස්තුව' රසවිඳිමින් විචාරය කරයි.
- "ජාතික තොටිල්ල" නිර්දිෂ්ට පද්‍ය රසවිඳිමින් විචාරය කරයි.

- **5, 6, 7 ප්‍රශ්නවලින් එකකට පමණක් උත්තර ලියන්න.**

**5. 'සිංහබාහු' යනු වත්මන් තරුණ පරපුරේ සිතුම් පැතුම් නියෝජනය කෙරෙන චරිතයකි. නිර්දිෂ්ට නාට්‍ය පෙළ ඇසුරෙන් උදාහරණ තුනක්වත් දක්වමින් විමසන්න. (ලකුණු 10 යි)**

'සිංහබාහු' යනු වත්මන් තරුණ පරපුරේ සිතුම් පැතුම් නියෝජනය කරන චරිතයක් බව සිංහබාහු නාට්‍යය ඇසුරින් උදාහරණ සහිත ව තහවුරු කර ගත හැකි ය.

- 'සිංහබාහු' සතු ව තිබූ විමසිලිමත්බව

උදා : "පියතුමගේ ගත නැරඹූ කල සිත
කුහුලින් ඉතිරෙන්නේ
නැත සම වන්නේ වෙනස පෙනෙන්නේ
විලස පියාණන්නේ"

- පුතු තරුණ වයසේ දී සිය පියා සමග ඇති වන ගැටුම සහ එහි දී පියා සිදු කරන ප්‍රකාශය ඔස්සේ සිංහබාහුට ඇති වන සිතුවිලි

උදා : "රොස් වී එදිනේ කී රුදු වදනේ
හද තුළ රැව් දෙන්නේ
අප නරයන් වග පැවසූ එ අරුමය
නැත මට වැටහෙන්නේ"

- සිය මව කියන සියලු දෑ, තරුණයකු ලෙස එලෙසින් ම පිළිගැනීමට මැළිකමක් දැක්වීම සහ කුතුහලයෙන් යුතු ව හැසිරීම

උදා: " සැප සයනා සුවඳ බොජුන්
කුමුල මාලිගා
ඇ සම්පත් හැරදා ඇයි
මෙලෙස වෙසෙන්නේ "

- සිය මව රජ කුමරියක් වේ යැයි ප්‍රකාශ කරමින් සිංහබාහු අභිමානයක් ඇති කර ගැනීම

උදා : "කුමරියක් වේ මගෙ මවු
උත්තරීතර ජන්ම ලද්දී
උරුම වූ යස ඉසුරටා..."

- තරුණයෙකු ලෙස තම අපේක්ෂා ඉටු කර ගැනීමට ආත්මාර්ථකාමී නොවී තමන්ට උරුම වූ ජීවිතය සොයා යන්නේ මව හා නැගණිය සමග යි.

උදා : "මේ ලෙනෙන් ඔබ දෙදෙන
මා සමග යා යුතු ය."

" නැගණිය මා වම් උරහිස මත ද ඔබ මා දකුණු උරහිස මත ද තබා ගෙන මේ ඝෝරතර වනාන්තරයෙන් එතර වන්නෙමි. "



CamScanner

- තරුණියකු ලෙස අභියෝග හමුවේ නොසැලී ඉදිරිය කරා යාමට ගල්ලෙනේ දොර පෙරළීම මගින් අර්ථවත් වන්නේ තමන් මෙතැන් සිට බාහිර ලෝකයට විවෘත වන බව ය.

උදා : "තර කර ගලිනා ඇති දොර තදිනා
ඉවත දමා වෙරෙනා
මහ හෙණ හඬිනා පහරා සැණිනා
පෙරළමි බාහුවෙනා "

- යුතුකම් හා අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටීම.

උදා : " මට ද හිමි වේ වංග රාජ්‍ය
ප්‍රබල නරවර පරපුරෙන් "
" වංග දේශේ වෙසෙන ජනතා
කෙරෙහි වේ මා යුතුකමා "

**මෙවැනි යෝග්‍ය උදාහරණ තුනක්වත් දක්වමින් පිළිතුර ඉදිරිපත් කර තිබිය යුතු ය.**

**6. කථා රසය උද්දීපනය වන අයුරින් සිද්ධි පෙළගැස්වීමේ දී කතුවරයා දක්වා ඇති කුසලතාව 'උග්ගසේන නම් සිටුපුත්හුගේ වස්තුව' ඇසුරෙන් උදාහරණ තුනක්වත් දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි)**

උග්ගසේන සිටුපුත්හුගේ කතා වස්තුවෙහි කතා රසය උද්දීපනය වන අයුරින් සිද්ධි පෙළ ගස්වා තිබීම

- උග්ගසේන සිටුපුත්‍රයා නැටුම් බැලීමට ගොස් විද්දත් දියණිය කෙරෙහි ඇති වූ බලවත් ප්‍රේමය ..

උදා : "ලදොත් ජීවත් වෙමි. නො ලදොත් මියෙමි."
" පුත තෙල ලෙස කිරිම තොපටත් අපටත් තරම් නො වෙයි."

- සිටුපුත්‍රයාගේ දෙමාපියන් විසින් විද්දත් දියණියගේ පියාට මසු දහසක් යවා දියණිය තම පුතණුවන්ට පාවා දෙන්න යැයි කළ ඉල්ලීම.

උදා : "ම දුව විකුණන්නා නැත. රන් හැර ගෙන නො දෙමි."
"නො ලදොත් මියෙත් නම් මිය ප්‍රයෝජන කිම් ද? "

- උග්ගසේන සිටුපුත්‍රයා දෙමාපියන්ට පිටුපා, විද්දත් දියණියගේ කුලය හා එක්වීම

"එසේ වී නම් මම උන් හා එක් වෙමි.. "
"අප හා එක් වන්නා ම දුව පාවා දෙමි. "

- විද්දත් දියණිය නොබෝ කලකින් පුතෙකු වදා නළවන විට උග්ගසේන සිටු පුත්‍රයාට බැන වදින අවස්ථාව.

"ගැල් රකිනවුගේ පුත" "බර උසුලන්නවුගේ පුත" "කුමකුත් නො දත්තවුගේ පුතැ 'යි කිය කියා..."
" අවකප්පනයෙන් සැදූ හසු රැන අල්වා ඇදි ඇදි සේ දුවන්නා සේ."

- උග්ගසේන සිටුපුත්‍රයා විද්දත් දියණියගේ බැනුම් ඉවසිය නොහැකි තැන ශිල්ප ඉගෙනීමට අධිෂ්ඨාන කර ගැනීම.

උදා : "ඇගේ ඒ බැවුම් පලවා මමත් ශිල්ප උගනිමි. "
"මයිලණුවන් කරා ගොසින් තමන් සමර්ථ හෙයින් උන් දන්නා ශිල්ප ඉගෙන..."

- උග්ගසේන සිටුපුත්‍රයා ශිල්ප ඉගෙන ගෙන අවසානයේ සෙනඟ පිරිවරා ශිල්ප දැක්වීම

උදා : "උග්ගසේන සිටුපුත්හු ද සැටරියන් හුණදණ්ඩක් බිම හිඳුවා ලා හුණදඬු අගට නැංගෝ ය. "

**මේ ආකාරයට උග්ගසේන සිටුපුත්හුගේ කතා වස්තුව ඇසුරින් කතා රසය උද්දීපනය වන අයුරින් උදාහරණ තුනක් සහිත ව සිද්ධි විස්තර කොට තිබිය යුතු ය.**

7. 'ජාතික තොටිල්ල' කවිපෙළේ සාර්ථකත්වයට උපයුක්ත භාෂා ශෛලියේ සුලලිත බව හේතු වී ඇත. නිර්දිෂ්ට කවි පෙළ ඇසුරෙන් උදාහරණ තුනක්වත් දක්වමින් විමසන්න. (ලකුණු 10 යි)

❖ භාෂාවේ සුලලිත බව

ඉතා සුන්දර, මනහර, අතිශයින් ලාලිත්‍ය වූ මෙන්ම,

පද සංඝටනය කරන ආකාරය අනුව ශබ්දයෙන් මෙන් ම අර්ථයෙන් ද ජනිත විය හැකි රිද්මානුකූල බව පිළිබඳ අවධානය යොමු කරමින් පිළිතුරු ලියා තිබීම අවශ්‍ය වේ.

උදාහරණ :

- මුනි සිරිපා සිඹිමින්නේ
  සමනොළ ගිරි පෙදෙසින්නේ
  මඳ සුළඟයි මේ එන්නේ
  මගේ පුතා නිදියන්නේ

- ජාතිය රන් විමනක් වේ
  ආගම මිණි පහනක් වේ
  එය රැක ගන්නට මෙ ලොවේ
  සමත් වෙතොත් පුත නුඹ වේ

- සිතිඳු මොලොක් බව මලෙහී
  පිරිසිදු බව පිනි බිඳෙහී
  එක් වී මා පුතුගෙ ළෙහී
  අරක් ගනී හැම දිනෙහී

ආදි යෝග්‍ය උදාහරණ තුනක්වත් දක්වමින් පිළිතුරු සපයා තිබිය යුතු ය.

වෙනත් සුදුසු උදාහරණ ද පිළිගන්න.

❖ 5, 6, 7 පිළිතුරු සඳහා,

| | |
|---|---|
| **උදාහරණ 3 ට** | **ලකුණු 03 යි.** |
| **සමස්ත විස්තරයට** | **ලකුණු 07 යි.** |
| | **මුළු ලකුණු 10 යි.** |

PAST PAPERS WIKI

(34) WWW.PastPapers.WiKi (34)

CamScanner